ශ්‍රී ලංකා මහ බැංකුව
සන්නිවේදන දෙපාර්තමේන්තුව

# සටහන

30 වෙළුම 5-6 කලාපය 2011 මැයි - ජුනි

## අඳුරෙන් එළියට



ශ්‍රී ලංකා මහ බැංකුවේ සමාජ හා ආර්ථික විද්‍යා ද්විමාසිකය

# අඳුරෙන් එළියට ...

"දුප්පතුන් නැති ලෝකයක්" පිළිබඳ සිහිනය අද ඊයේ දුටු එකක් නො වේ. එයට ඉතා දිගු ඉතිහාසයක් වෙයි. සිහින දැකීමෙන් පමණක් එවන් ලෝකයක් බිහි කර ගත නො හැකි බව අපි දනිමු. එ නමුත්, එ බඳු සිහින දැකීමේ වරදක් නැත. වරද ඇත්තේ සිහිනය සිහිනයක් පමණක් වීමට ඉඩ හැරීම තුළ ය. මෙය සැබෑ කර ගත යුතු සිහිනයකි.

සිහිනයක් සැබෑ කරගැන්ම උදෙසා මුලින් ම කළ යුත්තේ අවදිවීම ය. යා යුතු ගමන ගැන, කළ යුතු දේ නො කළ යුතු දේ ගැන මෙනෙහි කළ යුත්තේ එයින් අනතුරු ව ය. මෙය කළ යුත්තේ කෙ සේ ද? දුප්පත්කම ගැන අවබෝධ කරගැනීමෙනි. දුප්පත්කමට හේතු හඳුනාගැනීමෙනි. විසඳුමත් ඒ විසඳුම කරා යා හැකි මාර්ගයත් වටහා ගත හැකි වනු ඇත්තේ එයින් ඉක්බිති ව ය.

දුප්පත්කම ගැන දැනුමක් අපට වෙයි. එය බොහෝ දෙනකුට අත්දැකීමකි. බොහෝ විට අපි දිළිඳු ජීවිත ගත කොට ඇත්තෙමු. නැතහොත් තවමත් එහි ගිලී ජීවත්වෙමු. එ සේ නො වන අය සිටිය ද ඔවුනට තම දෑස් ඉදිරියේ ප්‍රදර්ශනය වන දිළිඳු බව තේරුම්ගත නො හැකි දුරවබෝධ එකක් නො වේ. ඒ ගැන පැහැදිලි දැනුමක්, අවබෝධයක් අප සැමට ම වෙයි. මෙම දැනුම විවිධාකාරයෙන් මැන සූත්‍රගත කොට ඇත. දිළිඳුකම පිළිබඳ ව ඇති අර්ථ දැක්වීම්වලින් ප්‍රකට කෙරෙන්නේ එම සූත්‍රගත කිරීම් ය. දිළිඳුකමට හේතුව ද විවිධාකාරයෙන් හඳුනාගෙන තිබේ. මේ සම්බන්ධයෙන් ඇති ප්‍රමුඛතම කාරණය වශයෙන් හුවා දක්වන්නේ ආදායම් බෙදීයාම පිළිබඳ ව පවත්නා ගැටලුව ය. එම ගැටලුව විසඳීමේ අටියෙන් දේශපාලනික ව්‍යාපාර පවා බිහි වී තිබේ. සමාජවාදය පිළිබඳ ව පවත්නා දහසකුත් එකක් මතවාද, මාක්ස්වාදය බඳු එවන් මතවාද මත පදනම් වූ විවිධ මෝස්තරයේ දේශපාලනික ව්‍යාපාර ඒ සඳහා උදාහරණ වෙයි.

කෙ සේ වෙතත්, බෙදාහැරීමට ධනයක් නැති තැන ඇති කළ හැකි සමාජවාදයක් නැත. ආදායම් බෙදීයාම පිළිබඳ ගැටලුව විසඳිය හැක්කේ ආදායම් ඉපදවීම සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගන්නේ නම් පමණකි. ඒ නිසා, ප්‍රමාණවත් තරම් ධනයක් රටක් සතු නො වීම දිළිඳුකමට මූලික ම හේතුව වශයෙන් සැළකිය යුතු වෙයි. ආර්ථික වර්ධනයේ බලාපොරොත්තු සඵල කර නො ගෙන සමාජ සාධාරණත්වය තුළින් පමණක් දිළිඳුකම තුරන්කිරීමට වෙර දැරීම තවත් සිහිනයක් පමණක් ම වනු ඇත. එය ඇතැම් විට සමාජය සන්තක ධනය විනාශ කරන රුදුරු සිහිනයක් වීමට ද ඉඩක් වෙයි. ඒ පිළිබඳ අත්දැකීම් අප කා හටත් වෙයි.

ආර්ථික වර්ධනය අත්පත් කරගත හැක්කේ ගතානුගතික ව නිෂ්පාදන කාර්යයේ ම නිරතවීමෙන් නො වේ. එය පුළුල් සහභාගීත්වයෙන් යුතු සැම දෙනා ගේ ම කාර්යයක් විය යුතු වෙයි. ඒ සඳහා සමාජය දැනුමෙන් පොහොසත් විය යුතු ය. සෞඛ්‍යයෙන් පිරිපුන් විය යුතු ය. ඒ සියල්ල අතරතුර දිළිඳුකමින් පීඩිත ව අසරණ ව සිටින අයට අතදීමේ මාර්ග ද සකසා ගත යුතු ය.

දිළිඳුකම පිටුදැකීම උදෙසා අප රටේ දියත් කොට ඇති ප්‍රයත්නය අගය කළ යුත්තේ මෙම කරුණු මත පදනම් වීමෙනි. දරිද්‍රතාව ගැනත්, එහි ප්‍රවනතා සහ දරිද්‍රතාව අවම කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග ගැනත් සාකච්ඡා කිරීමට මෙ වර "සටහන" ඉඩක් වෙන් කර ඇත්තේ ඒ සම්බන්ධයෙන් කෙරෙන සාකච්ඡාවකට වේදිකාවක් සැළසීමේ අටියෙනි. දිළිඳුකමේ අඳුරෙන් එළියට ඒමට අප රට තබා ඇති පියවර හඳුනාගැනීමට එම ඉඩකඩ ප්‍රයෝජනවත් වනවා නිසැක ය.

සටහන

ISSN 1391-3697

2011 මැයි / ජූනි

පිටපතක මිල : රු. 10.00

වාර්ෂික දායකත්වය : රු.240.00 (තැපැල් ගාස්තු ද ඇතුළත්ව)

සන්නිවේදන අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මහ බැංකුව නමට ලියන ලද මුදල් ඇණවුම්/චෙක්පත් පහත සඳහන් ලිපිනයට එවීමෙන් 'සටහන' තැපැලෙන් ගෙන්වා ගත හැකි ය.

අධ්‍යක්ෂ
සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ. පෙ. 590, කොළඹ


| ලිපි යොමුව | පිටුව |
|---|---|
| දරිද්‍රතාව, එහි ප්‍රවණතා සහ දරිද්‍රතාව අවම කිරීමේ ක්‍රියාමාර්ග | 3 |
| විනිමය අනුපාතිකය, විදේශ විනිමය ගනුදෙනුවල ව්‍යාපාරික පැතිකඩ | 10 |
| පාවෙන විනිමය අනුපාතික ක්‍රමය | 16 |
| බ්‍රෙට්න් වුඩ්ස් කතාව | 23 |


"සටහන" සඟරාවෙහි පළවන අදහස් ඒ ඒ ලේඛකයන් ගේ අදහස් මිස ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් නොවිය හැකි ය.

# දරිද්‍රතාව
## එහි ප්‍රවණතා සහ දරිද්‍රතාව අවම කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග

**ඩබ් ඒ දිල්රුක්ෂිනී**
**ඒ එස් ප්‍රනාන්දු**
ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව

මෙම සටහන මගින් දරිද්‍රතාව යන සංකල්පය නිර්වචනය කිරීමත්, දරිද්‍රතාව මිණුම් කිරීම සඳහා පවතින දරිද්‍රතා දර්ශක පිළිබඳ හැඳින්වීමක් සිදු කිරීමත්, ශ්‍රී ලංකාවේ දරිද්‍රතා උපනතීන් පිළිබඳ සාකච්ඡා කිරීමත්, දරිද්‍රතාව අවම කිරීම සඳහා ගෙන ඇති ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග විශ්ලේෂණය කිරීමත් අරමුණු කෙරේ.

**දරිද්‍රතාව යනු කුමක් ද?**

ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, එක්සත් ජාතීන්ගේ සංවිධානය වැනි විවිධ ජාත්‍යන්තර ආයතන දරිද්‍රතාව විවිධාකාරයට අර්ථ දක්වා ඇත. ලෝක බැංකුවේ නිර්වචනයට අනුව "දරිද්‍රතාව යනු ක්‍රය ශක්ති සාම්‍යයට ගැලපූ දෛනික ආදායම එක්සත් ජනපද ඩොලර් 2 ක් හෝ ඊට අඩු මට්ටමක පැවතීමයි". තව ද ලෝක බැංකුව "ක්‍රය ශක්ති සාම්‍යයට ගැලපූ දෛනික ආදායම එ.ජ.ඩොලර් 1.25 ක් හෝ ඊට අඩු මට්ටමක පැවතීම අන්ත දරිද්‍රතාව" වශයෙන් නිර්වචනය කර ඇත.

එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුව "දරිද්‍රතාව යන්නෙන් අදහස් වන්නේ ප්‍රධාන වශයෙන් ම අභිමතයන් හා අවස්ථාවන් අත්පත් කර ගැනීමට ඇති නොහැකියාව සහ මානව ගරුත්වය කඩවීමයි". සමාජය තුළ ක්‍රියාකාරී ලෙස සහභාගි වීමට අවශ්‍ය මූලික හැකියාවන් හිඟකමත්, අවශ්‍ය ආහාරපාන හා ඇඳුම් පැළඳුම් නොමැතිවීමත්, ණය පහසුකම් ලබා ගැනීමට නොහැකි වීමත්, අධ්‍යාපනය සහ සෞඛ්‍ය පහසුකම් වැනි මූලික අවශ්‍යතා සපුරා ගැනීමට නොහැකිවීම සහ ජීවත්වීම සඳහා රැකියාවක් නොමැතිවීම ද දරිද්‍රතාවයේ මූලික ලක්ෂණ වශයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය දක්වයි. තව ද, පුද්ගලික, ගෘහස්ථ සහ සමාජයීය වශයෙන් පවතින අනාරක්ෂිතභාවය, දුබලබව, සහ ආර්ථික කටයුතුවලින් ඉවත්වීම, ප්‍රචණ්ඩත්වයට පත්වීම සහ පිරිසිදු පානීය ජලය හා සනීපාරක්ෂක පහසුකම් රහිත පරිසරයක ජීවත්වීම ද එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුව දරිද්‍රතාව යන්නෙන් අදහස් වේ.

ආසියානු සංවර්ධන බැංකුවට අනුව "සෑම මනුෂ්‍යයකුට ම හිමිකමක් ඇති අත්‍යවශ්‍ය වත්කම් සහ අවස්ථා අහිමිවීම දරිද්‍රතාව යි." ආසියානු සංවර්ධන බැංකුවට අනුව දරිද්‍රතාවයේ මූලික ප්‍රභේද තුනකි.

1. **මානව දරිද්‍රතාව** - ප්‍රධාන වශයෙන් ම සාක්ෂරතාව හා පෝෂණය වැනි අත්‍යවශ්‍ය මානව හැකියාවන්හි හිඟකම මෙ මගින් අදහස් වේ.

2. **ආදායම් දරිද්‍රතාව** - අවම පරිභෝජන අවශ්‍යතා සපුරා ගැනීමට අවශ්‍ය වන ප්‍රමාණවත් ආදායමක් නොමැති වීම මෙ මගින් අදහස් වේ.

3. **නිරපේක්ෂ දරිද්‍රතාව** - ජීවන තත්ත්වය පවත්වා ගැනීම සඳහා අවශ්‍ය අවම අවශ්‍යතා පවා නො ලැබී යෑම මෙ මගින් අදහස් වේ. මෙය අවම කැලරි අවශ්‍යතාව සහ අත්‍යාවශ්‍ය ආහාරමය නොවන අවශ්‍යතා එකතුවෙන් මනිනු ලබන ස්ථිර මිණුමකි.

විවිධ ආයතන විවිධ නිර්වචන ඉදිරිපත් කළ ද, ඉතා සරළව දරිද්‍රතාව යන්නෙන් අදහස් වන්නේ ජනතාවට පිළිගත හැකි ජීවන මට්ටමක් අත්කර ගැනීමට නොහැකි වීමයි.

**දරිද්‍රතාව මැනීම**

දරිද්‍රතාව මැනීම සඳහා ආර්ථික විද්‍යාඥයින් විසින් විවිධ මිනුම් ඉදිරිපත් කර ඇත.

(i) **නිල දරිද්‍රතා රේඛාව**

ප්‍රමාණවත් ජීවන තත්ත්වයක් ළඟාකර ගැනීම සඳහා අවශ්‍ය වන අවම ආදායම් මට්ටම මෙයින් අදහස් වේ. ශ්‍රී ලංකාවේ නිල දරිද්‍රතා රේඛාව ගණනය කිරීම සඳහා ඉදිරිපත් කර ඇති දර්ශකයේ පදනම් වර්ෂය ලෙස 2002 වසර සැලකීමට ගෙන ඇති අතර, දර්ශකය සැකසීමේ දී අවම කැලරි මට්ටමක් ලෙස

කිලෝ කැලරි 2,030 ක ප්‍රමාණයක් ලබා ගැනීමට අවශ්‍ය වන පරිභෝජන වියදම සහ අත්‍යවශ්‍ය ආහාරමය නොවන ද්‍රව්‍ය සඳහා දැරිය යුතු වියදම නිල දරිද්‍රතා රේඛාව ලෙස දක්වා ඇත. 2002 පදනම් වසරේ දී රු.1,423/- ක් වූ මෙම නිල දිළිඳු රේඛාවේ අගය, 2002 පදනම් වසරේ දී 100 ක් වූ කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙන් යාවත්කාලීන කිරීමෙන් මාසික ව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් නිල දරිද්‍රතා රේඛාව ගණනය කරනු ලබයි. 2009/2010 ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දී නිල දරිද්‍රතා රේඛාව පුද්ගලයකු සඳහා මාසයකට රු. 3,028 ක් විය.

(ii) **ජනගහන දරිද්‍රතා දර්ශකය**

ජනගහන දරිද්‍රතා දර්ශකය මගින් මුළු ජනගහනයෙන්, නිල දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත්වන ජනගහනයේ ප්‍රතිශතය දැක්වේ.

(iii) **දරිද්‍රතා අන්තරය/ දරිද්‍රතා වෙනස**


දරිද්‍රතා අන්තරය යනු දිළිඳු පුද්ගලයෙකුට තම දුප්පත්කමින් මිදීමට අවශ්‍ය වන මුදල ඒ නම් එම පුද්ගලයාගේ මුළු පරිභෝජන වියදම සහ දරිද්‍රතා රේඛාවේ අගය අතර ඇති වෙනසයි.

**ආදායම් විෂමතාව මැනීම**

රටක ආදායම් විෂමතාව දරිද්‍රතාව කෙරෙහි බලපාන බවට පිළිගැනීමක් පවතී. එ හෙයින් ආදායම් විෂමතාව මිනුම් කිරීම ද දරිද්‍රතාව පිළිබඳ මිනුම් ගැන සැලකීමේ දී වැදගත් වේ. මන්ද යත්, කිසියම් රටක ආදායම් විෂමතාව ඉහළ අගයක් ගැනීම ඒ රටෙහි දරිද්‍රතාව ඉහළ යාමට හේතුවන බැවිනි.

(i) **ලෝරන්ස් වක්‍රය**

රූප සටහන 1: ලෝරන්ස් වක්‍රය




ලෝරන්ස් වක්‍රය සමාජ අසමානතාව මැනීමේ දර්ශකයක් ලෙස බොහෝ ආර්ථික විද්‍යාඥයෝ සළකති. ධනය බෙදීයාමේ විෂමතාව අධ්‍යයනය කිරීම සඳහා මැක්ස් ඕ. ලෝරන්ස් විසින් 1905 දී මෙය හඳුන්වා දෙන ලදී. ආදායම් ලබන්නන්ගේ සමුච්චිත ප්‍රතිශතයත් ජනගහනයේ එක් එක් ප්‍රතිශතයන් මගින් ඉපැයූ මුළු ආදායමේ ප්‍රතිශතයත් අතර ඇති සම්බන්ධතාව මෙම වක්‍රය මගින් පෙන්නුම් කරයි.

ලෝරන්ස් වක්‍රය විකර්ණයෙන් ඈත් ව පවතින ප්‍රමාණය මගින් පුද්ගල ආදායම බෙදීයාමේ අසමානතාව පෙන්නුම් කරයි.

(ii) **ගිනි සංගුණකය**


ගිනි සංගුණකය මගින් ආදායම් බෙදීයාමේ අසමානතාව දැක්වෙන අතර මෙය 0 හා 1 අතර අගයක් ගනී. 0 මගින් සමානතාව ද, 1 මගින් සර්ව විෂමතාව ද පෙන්වයි. 0 ට ආසන්නවීම මගින් ආදායම සාධාරණ ව බෙදී ගොස් ඇති බව පෙන්වා දෙයි. ගිනි සංගුණකයේ අගය ලබා ගනුයේ ලෝරන්ස් වක්‍රය ඇසුරෙනි.

$$\text{ගිනි සංගුණකය} = \frac{\text{A වර්ගඵලය}}{\text{A+B වර්ගඵලය}}$$

(iii) **කුස්නෙට්ස් වක්‍රය**

සයිමන් කුස්නෙට්ස් විසින් ඉදිරිපත් කරන ලද මෙම ප්‍රස්ථාරික නිරූපනය මගින් සංවර්ධනය වන රටක ආර්ථික විෂමතාව කාලයත් සමඟ ඉහළ ගොස් කිසියම් සාමාන්‍ය ආදායම් මට්ටමකට ළඟා වූ පසු එය පහළ යන ආකාරය දක්වයි.

රූප සටහන 2: කුස්නෙට්ස් වක්‍රය





**ශ්‍රී ලංකාවේ දරිද්‍රතා උපනතීන්**

ජනගහන දරිද්‍රතා දර්ශකය මගින් පෙන්නුම් කරන ආකාරයට ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව පසුගිය වසර කිහිපය තුළ තියුණු පහළ වැටීමක් පිළිබිඹු කරයි. ජනලේඛන හා සංඛ්‍යාලේඛන


දෙපාර්තමේන්තුව රට පුරා කුටුම්භ 25,000 ක් ආවරණය කරමින් කරනු ලබන කුටුම්භ ආදායම් හා වියදම් සමීක්ෂණය 2009/2010 සමීක්ෂණ වකවානුවේ ලබාගත් දත්තවලට අනුව 2006/2007 සමීක්ෂණයට අනුව සියයට 15.2 ක් ව පැවති ජනගහන දරිද්‍රතා දර්ශකය සියයට 8.9 ක් දක්වා පහළ වැටී ඇත. මෙම දරිද්‍රතා දර්ශකයේ පහළ වැටීම ග්‍රාමීය, නාගරික හා වතු සහ අංශ තුනෙහි ම දැකිය හැකි අතර, 3 වන සහ 4 වන රූප සටහන් මගින් එය පෙන්වා දෙනු ලබයි. වතු අංශයේ දරිද්‍රතාව සහ ග්‍රාමීය අංශයේ දරිද්‍රතාව සමස්ත දරිද්‍රතා දර්ශකයට වඩා ඉහළ අගයක් ගත්ත ද පසුගිය සමීක්ෂණ කාලය හා සසඳන කල තියුණු පහළ වැටීමක් පිළිබිඹු කරයි.

රූප සටහන 3: ජනගහන දරිද්‍රතා දර්ශකය
1990/91 සිට 2009/10




**මූලාශ්‍රය :** දරිද්‍රතා දර්ශකය මැයි 2011
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

රූප සටහන 4: ජනගහන දරිද්‍රතා දර්ශකයේ හැසිරීම - අංශ අනුව




**මූලාශ්‍රය :** දරිද්‍රතා දර්ශකය මැයි 2011
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

පහත සංඛ්‍යා සටහන මගින් දිස්ත්‍රික්ක මට්ටමින් ජනගහන දරිද්‍රතා දර්ශකයේ හැසිරීම පෙන්වා දෙයි.

සංඛ්‍යා සටහන 1: ජනගහන දරිද්‍රතා දර්ශකය
(දිස්ත්‍රික්කය අනුව)

| දිස්ත්‍රික්කය | සමීක්ෂණ වකවානුව | | | | |
|---|---|---|---|---|---|
| | 1990/91 | 1995/96 | 2002 | 2006/07 | 2009/10 |
| කොළඹ | 16.2 | 12.0 | 6.4 | 5.4 | 3.6 |
| ගම්පහ | 14.7 | 14.1 | 10.7 | 8.7 | 3.9 |
| කළුතර | 32.3 | 29.5 | 20.0 | 13.0 | 6.0 |
| මහනුවර | 35.9 | 36.7 | 24.9 | 17.0 | 10.3 |
| මාතලේ | 28.7 | 41.9 | 29.6 | 18.9 | 11.5 |
| නුවරඑළිය | 20.1 | 32.1 | 22.6 | 33.8 | 7.6 |
| ගාල්ල | 29.7 | 31.6 | 25.8 | 13.7 | 10.3 |
| මාතර | 29.2 | 35.0 | 27.5 | 14.7 | 11.2 |
| හම්බන්තොට | 32.4 | 31.0 | 32.2 | 12.7 | 6.9 |
| කුරුණෑගල | 27.2 | 26.2 | 25.4 | 15.4 | 11.7 |
| පුත්තලම | 22.3 | 31.1 | 31.3 | 13.1 | 10.5 |
| අනුරාධපුරය | 24.4 | 27.0 | 20.4 | 14.9 | 5.7 |
| පොලොන්නරුව | 24.9 | 20.1 | 23.7 | 12.7 | 5.8 |
| බදුල්ල | 31.0 | 41.0 | 37.3 | 23.7 | 13.3 |
| මොණරාගල | 33.7 | 56.2 | 37.2 | 33.2 | 14.5 |
| රත්නපුරය | 30.8 | 46.4 | 34.4 | 26.6 | 10.5 |
| කෑගල්ල | 31.2 | 36.3 | 32.5 | 21.1 | 10.8 |
| යාපනය | * | * | * | * | 16.1 |
| වව්නියාව | * | * | * | * | 2.3 |
| මඩකලපුව | * | * | * | 10.7 | 20.3 |
| අම්පාර | * | * | * | 10.9 | 11.8 |
| ත්‍රිකුණාමලය | * | * | * | * | 11.7 |

* - ලැබී නොමැත

**මූලාශ්‍රය :** දරිද්‍රතා දර්ශකය මැයි 2011
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

දරිද්‍රතා අන්තරය සම්බන්ධයෙන් බලන කල මානව දරිද්‍රතා දර්ශකය පහළ වැටීමක් පිළිබිඹු කළ ද, මිල උද්ධමනයේ බලපෑම හේතුවෙන් 2006/2007 සමීක්ෂණයේ දී මසකට රු. 434/- ක් වූ දරිද්‍රතා අන්තරය 2009/10 සමීක්ෂණයේ දී මසකට රු. 569/- ක් දක්වා ඉහළ ගොස් ඇති බව පෙනේ. 2 වන සංඛ්‍යා සටහන මගින් දරිද්‍රතා අන්තරයේ හැසිරීම පෙන්වා දෙයි. නාගරික අංශයේ දරිද්‍රතා අන්තරය මසකට රු. 680/- ක් වන අතර, 150,000 ක් වන නාගරික දිළින්දන් දරිද්‍රතාවයෙන් මුදවාලීමට නම් මසකට රු. මිලියන 108 ක මූල්‍ය සහනාධාර සැපයිය යුතුව ඇත.

සංඛ්‍යා සටහන 2: දරිද්‍රතා අන්තරය

| අංශය | දරිද්‍රතා අන්තරය (රු./මසකට) | | | |
|---|---|---|---|---|
| | එකතුව (මිලියන) | | සාමාන්‍යය | |
| | 2006/07 | 2009/10 | 2006/07 | 2009/10 |
| ශ්‍රී ලංකාව | 1257 | 1060 | 448 | 587 |
| නාගරික | 78 | 108 | 423 | 680 |
| ග්‍රාමීය | 1041 | 885 | 452 | 578 |
| වතු | 138 | 67 | 434 | 569 |

**මූලාශ්‍රය :** දරිද්‍රතා දර්ශකය මැයි 2011
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2006/2007 සමීක්ෂණයේ 0.49 ක් වූ ගෘහ ඒකක ආදායමේ ගිනි සංගුණකය 2009/2010 සමීක්ෂණ කාලයේ දී ද 0.49 ක් ව පැවතින. දරිද්‍රතාවයේ පහළ වැටීම මගින් අනිවාර්යයෙන් ම ගිනි සංගුණකයේ පහළ වැටීමක් අපේක්ෂා කළ නොහැක. ගෘහ ඒකක ආදායමේ ගිනි සංගුණකය 0.49 ක අගයක නොවෙනස් ව පැවතිය ද ආදායම් උපයන්නන් ගේ ආදායමේ ගිනි සංගුණකය 2009/2010 සමීක්ෂණයට අනුව 0.53 ක් වැනි ඉහළ අගයක් ගනී. 3 වන සංඛ්‍යා සටහන මගින් ගෘහ ඒකක ආදායම/ඒක පුද්ගල ආදායම හා ආදායම් උපයන්නන් ගේ ආදායමේ ගිනි සංගුණකය නාගරික ග්‍රාමීය හා වතු අංශය සම්බන්ධයෙන් සහ පළාත් මට්ටමින් දක්වා ඇත.

සංඛ්‍යා සටහන 3: ගෘහ ඒකක ආදායම, ඒක පුද්ගල ආදායම හා ආදායම් උපයන්නන් ගේ ආදායමේ ගිනි සංගුණකය

| අංශය සහ පළාත | ගිනි සංගුණකය | | |
|---|---|---|---|
| | ගෘහ ඒකක | ඒක පුද්ගල | උපයන්නා |
| ශ්‍රී ලංකාව | 0.49 | 0.46 | 0.53 |
| | | | |
| නාගරික | 0.45 | 0.47 | 0.53 |
| ග්‍රාමීය | 0.46 | 0.46 | 0.52 |
| වතු | 0.44 | 0.43 | 0.53 |
| | | | |
| බස්නාහිර | 0.45 | 0.46 | 0.54 |
| මධ්‍යම | 0.51 | 0.51 | 0.57 |
| දකුණ | 0.43 | 0.42 | 0.5 |
| නැගෙනහිර | 0.33 | 0.3 | 0.37 |
| වයඹ | 0.49 | 0.48 | 0.53 |
| උතුරු මැද | 0.39 | 0.39 | 0.47 |
| ඌව | 0.41 | 0.39 | 0.49 |
| සබරගමුව | 0.50 | 0.48 | 0.57 |

**මූලාශ්‍රය :** ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය 2009/10
ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකාවේ දිළිඳුකම තුරන් කිරීම සඳහා ගෙන ඇති උපාය මාර්ග**


ආර්ථික සංවර්ධනය පිළිබඳ සැළසුම් සකස් කරන සහ කටයුතු කරන ඕනෑ ම රටක ඒ පිළිබඳව වගකීම දරන රජයන් විසින් එම රටෙහි දරිද්‍රතාව අවම කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමටත්, ඒ සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමටත් උත්සුක වේ. ඒ මන්ද යත්, දරිද්‍රතාව අවම කිරීම හෝ තුරන් කිරීම රටේ සමාජ සංවර්ධනය කෙරෙහි සුවිශාල බලපෑමක් කරන හෙයිනි. ශ්‍රී ලංකාව දශක ගණනාවක් පුරා සමාජ සංවර්ධනය සම්බන්ධයෙන් සුවිශාල වැදගත්කමක් දක්වා ඇති අතර, දරිද්‍රතාව අවම කිරීම සඳහා ඒ සඳහා ම වෙන් වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කැප වී කටයුතු කර ඇත.

දරිද්‍රතාව අවම කිරීම සඳහා ඒ සඳහා වෙන් වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැදගත් වන අතර ම රටක සාර්ව ආර්ථික වාතාවරණය සහ යටිතල පහසුකම්වල ව්‍යාප්තිය ද දරිද්‍රතාව අවම කිරීම සඳහා අතිශය වැදගත් භූමිකාවක් නිරූපණය කරයි.

රටක සිදුවන ඉහළ ආර්ථික වර්ධනය, විශේෂයෙන් ම කෘෂිකාර්මික අංශයේ ආර්ථික වර්ධනය දරිද්‍රතාව අවම කිරීම සඳහා බලපාන වැදගත් සාධකයකි. එ සේ ම, ඉහළ ආර්ථික වර්ධනය මගින් වැඩි රැකියා අවස්ථා ප්‍රමාණයක් ජනනය වීම ද දරිද්‍රතාව අවම කිරීමට බලපාන ප්‍රධාන හේතුවක් වේ.

5 වන රූප සටහන හා 4 වන සංඛ්‍යා සටහන මගින් ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධනය පෙන්වා දෙනු ලබන අතර, එ මගින් කෘෂිකාර්මික හා සේවා අංශයේ ආංශික වර්ධනය ද පෙන්වා දෙනු ලබයි. එම දත්ත මගින් පැහැදිලි වනුයේ විශේෂයෙන් ම පසුගිය පස් වසරක කාලය තුළ කෘෂි අංශයේ ඇති වූ ආර්ථික වර්ධනය දරිද්‍රතාව අඩු කිරීම කෙරෙහි බලපා ඇති බවයි.

රූප සටහන 5: ආංශික දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන අනුපාතය




**මූලාශ්‍රය :** ශ්‍රී ලංකා මහ බැංකුව

සංඛ්‍යා සටහන 4: දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය

(සියයට)

| | වර්ෂය | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | 1970-80 | 1981-85 | 1986-90 | 1991-95 | 1996-00 | 2001-05 | 2006-10 |
| ද. දේ. නි. වර්ධනය | 4.1 | 5.2 | 3.4 | 5.4 | 5.0 | 4.0 | 6.4 |
| කෘෂිකර්මය | 2.5 | 4.6 | 1.2 | 2.3 | 1.4 | 0.5 | 5.5 |
| කර්මාන්ත | 3.8 | 3.1 | 5.3 | 7.3 | 6.3 | 3.6 | 6.8 |
| සේවා | 4.9 | 6.2 | 3.3 | 5.6 | 5.8 | 5.5 | 6.3 |

**මූලාශ්‍රය** : ශ්‍රී ලංකා මහ බැංකුව

එ සේ ම, ශ්‍රී ලංකාවේ පසුගිය වසර 2 ක කාලය තුළ ප්‍රාදේශීය වශයෙන් සමබර ආර්ථික වර්ධනයක් අත්කර ගැනීමට අනුගමනය කළ විවිධ ප්‍රතිපත්තිමය ක්‍රියා මාර්ග හේතුවෙන් දළ දේශීය නිෂ්පාදිතයට ප්‍රාදේශීය වශයෙන් දක්වන දායකත්වයෙහි වෙනස්කම් සිදු වී ඇත. එ නම්, දළ දේශීය නිෂ්පාදිතයට අඩු දායකත්වයක් දැක්වූ ප්‍රදේශවල දායකත්වය ඉහළ යෑමක් පෙන්නුම් කරයි. මෙම ප්‍රාදේශීය ව සිදුවන ආර්ථික කටයුතුවල දියුණුව ද දරිද්‍රතාව අඩුකිරීම සඳහා හේතු වී ඇත.

සංඛ්‍යා සටහන 5: පළාත් අනුව දළ දේශීය නිෂ්පාදිතය

| පළාත | වර්ෂය හා ද.දේ.නි. දායකත්වය (ප්‍රතිශතය) | | | | |
|---|---|---|---|---|---|
| | 2005 (අ) | 2006 | 2007 | 2008 (ආ) | 2009 (ඇ) |
| බස්නාහිර | 50.8 | 50.1 | 46.5 | 45.4 | 45.1 |
| දකුණ | 8.9 | 10.0 | 10.5 | 10.5 | 10.2 |
| සබරගමුව | 6.4 | 6.1 | 6.4 | 6.4 | 6.3 |
| මධ්‍යම | 8.5 | 8.8 | 9.6 | 9.8 | 9.6 |
| ඌව | 4.5 | 4.3 | 4.9 | 4.5 | 4.6 |
| නැගෙනහිර | 4.7 | 9 | 5.2 | 5.6 | 5.8 |
| වයඹ | 8.9 | 9.1 | 9.9 | 9.9 | 10.3 |
| උතුරුමැද | 4.3 | 4.0 | 4.0 | 4.7 | 4.8 |
| උතුර | 3.0 | 2.8 | 2.9 | 3.2 | 3.3 |
| එකතුව | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 |

(අ) 2005 වසරේ ඇස්මේන්තු ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, පවත්නා සාධක මිල අනුව සම්පාදිත ජාතික ගිණුම් මත පදනම් වේ.


(ආ) සංශෝධිත

(ඇ) තාවකාලික

**මූලාශ්‍රය** : ශ්‍රී ලංකා මහ බැංකුව

ඉහළ ආර්ථික වර්ධනයත් සමඟ රටේ වැඩි රැකියා අවස්ථා ප්‍රමාණයක් ජනනය වීම ද දරිද්‍රතාව අඩු කිරීම කෙරෙහි බලපා ඇත. 2009 දී සියයට 5.8 ක් වූ සේවා වියුක්ති අනුපාතිකය 2010 වසරේ දී සියයට 4.9 ක් දක්වා පහළ බැස ඇත. 2000 දී සියයට 11.1 ක්ව පැවති ස්ත්‍රී විරැකියාව ද සියයට 7.7ක් දක්වා පහළ ගොස් ඇත. විශේෂයෙන් ම, ස්ත්‍රීන් වැඩි වශයෙන් ශ්‍රම බලකායට එකතුවීම දරිද්‍රතාව අඩුවීමට බලපාන සාධකයකි. ප්‍රාදේශීය මට්ටමින් සලකා බැලුව ද සේවා වියුක්ති අනුපාතිකයේ පහළ වැටීමක් දැකිය හැකිය.

රූප සටහන 6: සේවා වියුක්ති අනුපාතිකය
2001 - 2010




(අ) සියළුම දිස්ත්‍රික්ක ඇතුළත් ය.

(ආ) උතුරු පළාත හැර

(ඇ) කිලිනොච්චි හා මුලතිව් දිස්ත්‍රික්ක හැර

(ඉ) උතුරු හා නැගෙනහිර පළාත් හැර

**මූලාශ්‍රය** : ශ්‍රම බලකා සමීක්ෂණය (විවිධ සමීක්ෂණ වාර්තා)
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

විදේශීය ප්‍රේෂණ ඉහළ අගයක් ගැනීම, එ නම්, ශ්‍රී ලාංකිකයන් වැඩි වශයෙන් විදේශීය රැකියා සඳහා විදෙස්ගතවීම හා ඉන් උපයන ආදායම් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කිරීම ද දරිද්‍රතාව අඩු වීමට හේතු වී ඇත. පසුගිය දශකය පුරා ම විදේශීය ප්‍රේෂණ ඉහළයාමේ නැඹුරුතාවක් පෙන්නුම් කරයි. පසුගිය දශකයේ විදේශ ප්‍රේෂණවල සංයුක්ත වාර්ෂික වර්ධන අනුපාතය සියයට 18.2 කි. (7 වන රූප සටහන සහ 7 වන සංඛ්‍යා සටහන බලන්න)

දරිද්‍රතාව අඩු කිරීම සඳහා අනුගමනය ලද සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සම්බන්ධයෙන් බලන කල රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය තුළ නිදහස් අධ්‍යාපනය සහ සෞඛ්‍ය සඳහා දරන ලද රාජ්‍ය වියදම සලකා බැලීම වැදගත් වේ. ශ්‍රී ලංකාව දශක ගණනාවක් තිස්සේ නිදහස් අධ්‍යාපනය සහ නිදහස් සෞඛ්‍ය පවත්වාගෙන යාම සඳහා සැළකිය යුතු වශයෙන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපාදන වෙන් කොට ඇත. අධ්‍යාපනය හා සෞඛ්‍ය රටක සමාජ සංවර්ධනය කෙරෙහි බලපාන මූලික සාධක වන අතර, නිරෝගිමත්, කුසලතා සම්පන්න ශ්‍රම බලකායක් සිටීම රටක ආර්ථික වර්ධනය සඳහා ද වැදගත් වේ. නිපුණතා සහිත නිරෝගිමත් පුද්ගලයකු ලෙස

ශ්‍රම බලකායට ඇතුළත්වීමට ඇති හැකියාව දරිද්‍රතාව අඩු කිරීමට බලපාන සාධකයකි. 8 වන සහ 9 වන රූප සටහන් දෙක මගින් පසුගිය වසර කිහිපය තුළ සෞඛ්‍ය හා අධ්‍යාපනය සඳහා රජය දුරන ලද වියදම් දැක්වේ.

සංඛ්‍යා සටහන 6: පළාත් අනුව විරැකියා අනුපාතය

| පළාත | ස්ත්‍රී | | පුරුෂ | | සමස්ත | |
|---|---|---|---|---|---|---|
| | 2000 | 2010 | 2000 | 2010 | 2000 | 2010 |
| බස්නාහිර | 10.8 | 6.0 | 6.7 | 2.6 | 8.0 | 3.7 |
| මධ්‍යම | 13.3 | 9.6 | 5.5 | 5.1 | 8.5 | 6.7 |
| දකුණ | 17.6 | 11.6 | 7.9 | 5.9 | 11.1 | 7.8 |
| නැගෙනහිර | * | 11.9 | * | 3.1 | * | 5.3 |
| වයඹ | 7.9 | 7.1 | 3.4 | 3.5 | 5.0 | 4.8 |
| උතුරුමැද | 8.2 | 6.4 | 3.8 | ✪ | 5.2 | 3.6 |
| ඌව | 5.2 | 7.2 | 4.1 | * | 4.6 | 4.1 |
| සබරගමුව | 11.2 | 6.1 | 6.5 | 3.6 | 8.0 | 4.6 |
| උතුර | * | * | * | * | * | * |
| එකතුව | 11.1 | 7.7 | 5.8 | * | 7.6 | 4.9 |

* ලැබී නොමැත


✪ නිවැරදි ඇස්තමේන්තුවක් කිරීමට නියැදිය ප්‍රමාණවත් නොවීය.

**මූලාශ්‍රය :** ශ්‍රම බලකා සමීක්ෂණය (විවිධ සමීක්ෂණ වාර්තා)
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

සාර්ව ආර්ථික වාතාවරණය හැරුණු කොට, සමාජ සුභ සාධනය වෙනුවෙන් ම දුගීකම අඩු කිරීම ඉලක්ක කොට ගෙන රජය විසින් ක්‍රියාත්මක කරන සුභසාධන යෝජනා ක්‍රම ද ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව අඩු කිරීම සඳහා උපකාරී වී ඇත. සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන දිළිඳුකම තුරන් කිරීමේ වැඩසටහන් අතර සමෘද්ධි සහනාධාර වැඩසටහන, පෝෂණ දීමනා වැඩසටහන, සමෘද්ධි සමාජ ආරක්ෂණ වැඩසටහන, භූමිතෙල් සහනාධාරය, ප්‍රජා සංවර්ධන වැඩසටහන් සහ කුසලතා සංවර්ධන වැඩසටහන් වැදගත් වේ.

මරණ, රෝගාතුරවීම් වැනි අනපේක්ෂිත සිදුවීම් නිසා දිළිඳු පවුල් තවදුරටත් දරිද්‍රතාවයේ පතුලට ම වැටීම වැළැක්වීම සඳහා සමෘද්ධි සමාජ ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක වේ. සමාජ සංවර්ධන වැඩසටහන් යටතේ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් ඉන් මුදවාගැනීම සඳහා සදාචාරාත්මක සංවර්ධන වැඩසටහන් ප්‍රාදේශීය ලේකම් මට්ටමෙන් ක්‍රියාත්මක කෙරිණි. විශේෂයෙන් ම, ගෘහ මූලිකයා මත්පැන්වලට ඇබ්බැහිවීම කුටුම්භ දරිද්‍රතාවට ගොදුරුවීමට බලපාන හේතු අතර කැපී පෙනෙන හේතුවක් ලෙස හඳුනාගෙන ඇත. රජය දරිද්‍රතාව අඩු කිරීම සඳහා ක්‍රියාත්මක කරන සුභසාධන යෝජනා ක්‍රම රැසක් 8 වන සංඛ්‍යා සටහනෙහි දැක්වෙන අතර ඒ සඳහා දරන ලද රාජ්‍ය වියදම ද එහි දැක්වේ.

රූප සටහන 7: විදේශීය ප්‍රේෂණ ලැබීම් 2001 - 2010




**මූලාශ්‍රය :** ශ්‍රී ලංකා මහ බැංකුව

දරිද්‍රතාව අඩු කිරීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය සේවා (Micro Finance) යොදා ගැනීම ද බොහොමයක් දියුණු වෙමින් පවතින රටවල මෙන් ම ලංකාවේ ද දැකිය හැකි ප්‍රවණතාවකි. දිළිඳුකම අවම කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන උපාය මාර්ගවල දී කාර්යක්ෂම ඉතිරිකිරීම්, ණය හා රක්ෂණ පහසුකම් සැපයීම සහ ඒ සඳහා ප්‍රවිශ්ඨ වැඩි කිරීම දියුණු කිරීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. විශේෂයෙන් ම ක්ෂුද්‍ර මූල්‍ය සේවා දිළිඳු කාන්තාවන් සවිබල ගැන්වීමට හා ඔවුනට ව්‍යවසායකයින් වශයෙන් නැගී සිටීමට උපකාරීවීම මගින් දරිද්‍රතාව අඩු කිරීම සඳහා ක්‍රියාකාරී ව මැදිහත් වේ.


රට පුරා යටිතල පහසුකම් දියුණු කිරීම මගින් සර්ව සහභාගීත්වයක් සහිත වර්ධනයක් කරා යොමුවීම ද දරිද්‍රතාව අවම කිරීම සඳහා ගෙන ඇති වැදගත් ප්‍රතිපත්තිමය වෙනස්වීමක් ලෙස හඳුනාගත හැක. සර්ව සහභාගීත්වයක් සහිත වර්ධනය (Inclusive Growth) මගින් අවධාරණය කෙරෙනුයේ පුද්ගලයින්ට ආර්ථික කටයුතුවලට දායක වීමට ඇති හැකියාව

සංඛ්‍යා සටහන 7: විදේශීය ප්‍රේෂණ ලැබීම් 2001 - 2010

| වර්ෂය | විදේශ ප්‍රේෂණ (රු. මිලියන) | වර්ධන අනුපාතය % |
|---|---|---|
| 2001 | 103,180 | 17.7 |
| 2002 | 123,183 | 19.4 |
| 2003 | 136,475 | 10.8 |
| 2004 | 158,291 | 16.0 |
| 2005 | 195,256 | 23.4 |
| 2006 | 224,663 | 15.1 |
| 2007 | 276,728 | 23.2 |
| 2008 | 316,118 | 14.2 |
| 2009 | 328,801 | 21.1 |
| 2010 | 465,372 | 21.6 |


**මූලාශ්‍රය :** ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 8: සෞඛ්‍ය සඳහා වියදම (රු. මිලියන)




**මූලාශ්‍රය :** ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 9: අධ්‍යාපනය සඳහා වියදම (රු. මිලියන)




**මූලාශ්‍රය :** ශ්‍රී ලංකා මහ බැංකුව

වැඩි දියුණු කිරීම හා රැකියා අවස්ථා ජනනය කිරීම සඳහා සුදුසු ව්‍යාපාරික පරිසරයක් ගොඩ නැගීම වන අතර, එය ආදායම් ප්‍රතිව්‍යාප්තිය යන සංකල්පයට වඩා වෙනස් වේ. විශේෂයෙන් ම, රජයේ යටිතල පහසුකම් සංවර්ධන වැඩපිළිවෙල, සමාජ හා ආර්ථික අසමානතා ඵලදායි ලෙස අඩු කරමින් සමාජ ආර්ථික සංවර්ධනය වැඩි දියුණු කිරීමට හැකිවෙන පරිදි ආර්ථික වර්ධනය පුළුල් පදනමක් සහිත, වේගවත් වර්ධනයක් බවට පරිවර්තනය කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වන අතර, එ් මගින් ආර්ථික කටයුතුවලට සහභාගිවීමට සැමට අවස්ථාව සලසාදීම බලාපොරොත්තු වේ.

එම නිසා, රජයේ යටිතල පහසුකම් වැඩසටහන යටතේ ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම තුළින් ප්‍රාදේශීය වශයෙන් සමබර ආර්ථික වර්ධනයන් අත්පත් කර ගැනීම සඳහා ආර්ථික කටයුතුවලට සහභාගිවීමට පුළුල් අවස්ථා ප්‍රාදේශීය වශයෙන්

සංඛ්‍යා සටහන 8: සුභසාධන යෝජනා ක්‍රම

(රු. මිලියන)

| වැඩසටහන | 2005 | 2010 |
|---|---|---|
| සමෘද්ධි | 9,103 | 9.241 |
| ළදරු කිරිපිටි සහනාධාරය | - | 388 |
| ත්‍රිපෝෂ වැඩසටහන | 504 | 865 |
| පාසල් පෝෂණ ආහාර වැඩසටහන | 166 | 2,474 |
| නොමිලේ පෙළ පොත් සහ වාර ප්‍රවේශ පත්‍ර | 1,341 | 3,311 |
| පාසල් නිල ඇඳුම් | 1,060 | 949 |
| අවතැන්වූවන්ට පිසූ ආහාර සහ වියළි සළාක ලබාදීම | 1,592 | 1,016 |
| තිරිඟු පිටි සහනාධාරය | - | - |
| පොහොර සහනාධාරය | 6,846 | 26,028 |
| සෞඛ්‍ය | 44,851 | 73,835 |
| වර්තන වියදම් | 34,113 | 60,506 |
| ප්‍රාග්ධන වියදම් සහ ණය | 10,738 | 13,329 |
| අධ්‍යාපනය | 63,557 | 104,248 |
| වර්තන වියදම් | 50,697 | 85,195 |
| ප්‍රාග්ධන වියදම් සහ ණය | 12,860 | 19,053 |

**මූලාශ්‍රය :** මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යංශය

ඇති කිරීම ද, ආර්ථික කටයුතුවලට අඩු දායකත්වයක් දක්වන ප්‍රදේශ හා ආර්ථික කටයුතුවලට වැඩි දායකත්වයක් දක්වන ප්‍රදේශ අතර සම්බන්ධතාව ගොඩ නැගීම ද, ශ්‍රම හා භාණ්ඩ සංචලතාව දියුණු කිරීම මගින් වෙළෙඳපොළ සම්බන්ධතා ගොඩ නැගීම ද අපේක්ෂා කෙරේ. මේ අනුව, දශක ගණනාවක් තිස්සේ ශ්‍රී ලංකාවේ අනුගමනය කරන ලද රාජ්‍ය ප්‍රතිපත්ති, දරිද්‍රතාව අඩු කිරීමට මෙන් ම, රට ආර්ථික වශයෙන් ඒකාබද්ධ කිරීමට සහ සෑම ප්‍රදේශයක ම ජීවත්වන ජනතාවට පොදු සේවාවන්ට ප්‍රවිශ්ඨවීමට ඇති අවස්ථාව සලසා දී ඇති අතර, තවදුරටත් මෙම අභියෝගය ජය ගැනීම සඳහාත්, දරිද්‍රතාව තුරන්කිරීම සඳහාත්, ආර්ථික ප්‍රතිලාභ සියළුම කුටුම්භවලට ගලායාම සඳහාත්, සෞඛ්‍ය හා අධ්‍යාපන ප්‍රතිපත්ති යළි හැඩ ගැස්වීම තුළින් මානව ප්‍රාග්ධන පදනම වැඩි දියුණු කිරීම, ජනතාවට ණය සඳහා ප්‍රවිශ්ඨය වැඩි දියුණු කිරීම සහ දරිද්‍රතාව අඩුකිරීම සඳහා දිළිඳු සහන මනාව ඉලක්ක ගත කිරීම තුළින් සමාජ ආරක්ෂණ ජාල වැඩි දියුණු කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ වැඩි අවධානය යොමු විය යුතුව ඇත. ✪

### පරිශීලනය කළ ග්‍රන්ථ

Todaro, M.P. and Smith, S.C. (2003) Economic Development, 8th Edition, Pearson Education, New Delhi, India.

ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය (2009/2010) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

වාර්ෂික වාර්තා - ශ්‍රී ලංකා මහ බැංකුව

# විනිමය අනුපාතිකය
## විදේශ විනිමය ගනුදෙනුවල ව්‍යාපාරික පැතිකඩ සහ ආර්ථික වැදගත්කම

**කේ ඩී ආර් පියතිලක**

නියෝජ්‍ය අධ්‍යක්ෂ, සන්නිවේදන දෙපාර්තමේන්තුව

### හැඳින්වීම

විනිමය අනුපාතිකය යනු එක් මුදල් වර්ගයකට අනුව තවත් මුදල් වර්ගයක මිලයි. උදාහරණයක් ලෙස විදේශ මුදල් ඒකකයක් මිල දී ගැනීම සඳහා අවශ්‍ය දේශීය මුදල් ඒකක ගණන හෝ දේශීය මුදල් ඒකකයක් මිල දී ගැනීම සඳහා අවශ්‍ය විදේශීය මුදල් ඒකක ගණන විනිමය අනුපාතිකය වශයෙන් හැඳින්වේ. විදේශීය මුදල් ඒකකයක් සඳහා ගෙවිය යුතු දේශීය මුදල් ඒකක ගණන සෘජු කතනය (Direct Quote) ලෙස ව්‍යවහාර වන අතර ලෝකයේ රටවල් බොහොමයක් මෙම ව්‍යවහාරය යොදාගනී. අනෙක් අතට දේශීය මුදල් ඒකකයන් මිල දී ගැනීම සඳහා අවශ්‍යය විදේශීය මුදල් ඒකක ගනන වක්‍ර කතනය (Indirect Quote) ලෙස ව්‍යවහාර වන අතර මෙම ක්‍රමය එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය සහ යුරෝ කලාපීය රටවල ව්‍යවහාර වේ.

මුදල්, චෙක්පත් හෝ වෙනත් අරමුදල් හුවමාරු කරන ක්‍රියාවලියක් මගින් දේශීය ආර්ථිකය තුළ විවිධ පාර්ශ්ව අතර සිදුකරනු ලබන අනාගත හෝ එදිනෙද ගනුදෙනු සිදු කළ හැකිය. නමුත් අන්තර්ජාතික වශයෙන් ගනුදෙනු පියවීම් දේශීය ගෙවීම් පියවීම්වලට වඩා සංකීර්ණ ය. උදාහරණයක් ලෙස ශ්‍රී ලංකාවේ ආනයනකරුවකු යම් භාණ්ඩයක් ඉන්දියාවෙන් ගෙන්වනු ලබන්නේ නම් වෙළෙඳ ක්‍රමය වන්නේ එම භාණ්ඩ තොග, ඇමරිකානු එක්සත් ජනපද ඩොලර්වලින් මිල ගණන් ඉදිරිපත් කිරීමයි. මෙහි දී ආනයනකරුට අදාළ ගෙවීම් කිරීම සඳහා තම රුපියල් වෙනුවට ඇ.එ.ජ ඩොලර් ලබාගැනීමට සිදු වේ. එ මෙන් ම ඉන්දියාවේ සිටින අපනයනකරුට, ඔහුගේ නිෂ්පාදන ක්‍රියාවලිය සිදුකරගෙන යාමට හා එරට තුළ ගෙවීම් කිරීම සඳහා ඔහුගේ අපනයන මත ලැබුන ඩොලර් ඉන්දියානු රුපියල්වලට පරිවර්තනය කිරීමට සිදු වේ. ජාත්‍යන්තර ගනුදෙනුවල දී ආනයන අපනයන හෝ වෙනත් ගෙවීම් සඳහා පිළිගත් පරිවර්ත්‍ය විදේශ මුදල් වර්ග (Convertible Foreign Currencies) යොදගනු ලබයි. මේ නිසා රටවල්වලට ජාත්‍යන්තර ව ගෙවීම් පියවීම් සිදුකිරීම සඳහා මුදල් වර්ග විකිණීමට හා මිල දී ගැනීමට සිදුවීමෙන් විදේශ විනිමය වෙළෙඳපොළ ජාලයක් බිහි වී ඇති අතර මෙම විදේශ විනිමය වෙළෙඳපොළ ජාත්‍යන්තර ව විවිධ සන්නිවේදන ක්‍රම ඔස්සේ එකිනෙකට සම්බන්ධ වී ඇත.

### විනිමය අනුපාතික ක්‍රම

ලෝකයේ විවිධ රටවල් විවිධ විනිමය අනුපාතික ක්‍රම භාවිතා කරන බව වගුව 1 මගින් දක්වා ඇත. මෙ ලෙස විවිධ විනිමය අනුපාතික ක්‍රම ව්‍යවහාරයේ පැවතිය ද විෂයාත්මකව විග්‍රහ කිරීමේ දී ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමය හා පාවෙන විනිමය අනුපාතික ක්‍රමය ගැන වැඩි අවධානයක් යොමුකර ඇත.

ස්ථිර විනිමය අනුපාතික ක්‍රමයක් යනු රජය මැදිහත් වීමෙන් බලධාරීන් තම මුදල් වර්ගයේ විනිමය අනුපාතිකය අනෙක් මුදල් වර්ගවලට සාපේක්ෂ ව ස්ථිර අනුපාතයකට නැතහොත් කලින් තීරණය කළ අගයේ පටු අන්තරයක් තුළ පවත්වා ගැනීමට උත්සාහ කරන ක්‍රමයකි. උදාහරණයක් ලෙස 1950 සිට 1976 දක්වා ශ්‍රී ලංකාවේ පැවැතියේ මෙ වැනි ක්‍රමයකි. 1950 සිට 1967 දී සිදුකරන ලද අවප්‍රමාණය දක්වා ම එක දිගට ම විනිමය අනුපාතිකයේ අගය එක්සත් ජනපද ඩොලර් 1 ක් රුපියල් 4.76 ක ස්ථාවර අගයක පවත්වාගෙන යනු ලැබීම දැක්විය හැකි ය. මෙ ලෙස විනිමය අනුපාතිකය ස්ථාවර අගයක පවත්වාගෙන යනු ලැබුව ද රටකට ගෙවුම් ශේෂ ගැටලු හෝ විනිමය අනුපාතිකය නිසා දැඩි ආර්ථික පීඩනවලට මුහුණපෑමට සිදුවුවහොත් හෝ අනෙක් අතට රටක ආර්ථික දියුණුව මත පිළිවෙලින් විනිමය අනුපාතිකය අවප්‍රමාණය (Devaluation) හෝ අතිප්‍රමාණය (Revaluation) කිරීමට හැකියාවක් ඇත. එහෙත් බ්‍රෙට්න් වුඩ්ස් ක්‍රමය අනුගමනය කළ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ රටවල්වලට දෙවන ලෝක යුද්ධයෙන් පසු එසේ විනිමය අනුපාතිකයේ 10% කට වැඩි වෙනස්කමක් කළ හැකි වුනේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අනුමැතිය සහිත ව ය.

ස්ථාවර විනිමය අනුපාතික ක්‍රම පිළිබඳ ඉතා අන්තගාමී තත්ත්වය වුනේ මුදල් මණ්ඩල ක්‍රමය සහ විදේශීය මුදල් වර්ගයක් තම රටවල මුදල් ලෙස භාවිතා කළ රටවල් ය. ඉහත වගුව 1 හි දැඩි ස්ථිර අනුපාතික යටතේ දක්වා ඇත්තේ මෙම විනිමය අනුපාතික රජයනය. දැඩි ස්ථිර විනිමය අනුපාතික ක්‍රමයක් හෝ පාවෙන විනිමය අනුපාතික ක්‍රමයක් අනුගමනය නො කළ රටවල් විනිමය අනුපාතිකය යම් සීමාවන් තුළ දෝලනය වීමට ඉඩ දෙමින් මෘදු ස්ථිර අනුපාතික ක්‍රම ව්‍යවහාර කරන ලදී. මෙම ක්‍රමවල දී මූල්‍ය අධිකාරීහු විනිමය අනුපාතිකය ස්ථිර සාමාන්‍යයක පවත්වා ගැනීම සඳහා සෘජුව එ නම් විදේශ විනිමය, මුදල් වෙළෙඳපොළේ විකිණීමෙන් හෝ මිල දී ගැනීමෙන් හෝ වක්‍රව එ නම් පොලී අනුපාතික ප්‍රතිපත්ති, විදේශ විනිමය රෙගුලාසි, විදේශ විනිමය කටයුතු

සම්බන්ධ යහපාලන හෝ රාජ්‍ය ආයතන මැදිහත්වීමේ ක්‍රම මගින් කටයුතු කරනු ලබයි. වගුව අංක 1 හි මෘදු ස්ථිර අනුපාතික යටතේ දක්වා ඇත්තේ විදේශ විනිමය අනුපාතික පිළිබඳ මෙම ක්‍රමය ය.

පාවෙන විනිමය අනුපාතික යනු මුල්‍ය බලධාරීන් ගේ මැදිහත් වීමක් නොමැතිව වෙළෙඳපොළ බලවේග යටතේ විදේශ විනිමය අනුපාතික තීරණය වීමයි. විදේශ විනිමය ගනුදෙනු සඳහා විදේශීය මුදල් වර්ග මිලට ගැනීමේ හා විකිණීමේ ප්‍රතිඵලයක් ලෙස මුදල් වර්ග සඳහා ඉල්ලුමක් සහ සැපයුමක් ඇති වේ. යම් ආර්ථිකයක් නිදහස් වෙළෙඳපොළ බලවේග යටතේ ක්‍රියාත්මක වන්නේ නම් මුදල් වර්ගවලට ඇති මෙම ඉල්ලුම හා සැපයුම යන වෙළෙඳපොළ බලවේග මගින් තීරණය වන විනිමය අනුපාතිකය පාවෙන විනිමය අනුපාතික ක්‍රමය යි. ජාත්‍යන්තර ගනුදෙනුවල දී එක් රටක මුදල් තවත් රටක ගනුදෙනු සඳහා පිළිනොගන්නා විට මුදල් වර්ග, මිලට ගැනීමට හා විකිණීමට සිදුවන බැවින් ඉහත කී කිනම් හෝ විදේශ විනිමය අනුපාතික ක්‍රමයක් සෑම රටකට ම යොදාගැනීමට සිදු වේ.

ලෝකයේ බොහෝ රටවල් තම විනිමය අනුපාතික ප්‍රකාශයට පත්කර ඇත්තේ ජාත්‍යන්තර වෙළෙඳපොළ ප්‍රධාන සහභාගිවන්නන් ගේ මුදල් වර්ගවලට සාපේක්ෂව ය. දැනට ද ජාත්‍යන්තර ගෙවීම් පියවීම්වලින් 50% ක් ඇමරිකා එක්සත් ජනපද ඩොලර්වලින් සහ යුරෝවලින් සිදු වේ. ලෝකයේ සමස්ත ජාත්‍යන්තර ගෙවීම් හා පියවීම්වලින් 80% ක් සිදුවනුයේ එක්සත් ජනපද ඩොලර්, යුරෝ, මහා බ්‍රිතාන්‍ය පවුම්, ජපාන යෙන්, කැනේඩියානු ඩොලර් සහ ඕස්ට්‍රේලියානු ඩොලර් වැනි ජාත්‍යන්තර විදේශ විනිමය වෙළෙඳපොළ ප්‍රධාන සහභාගිකරුවන්ගේ මුදල් මගින් ය.

**වගුව 1**

**ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සාමාජික රටවල විනිමය අනුපාතික ක්‍රම**

| විනිමය අනුපාතික ක්‍රමය | භාවිත රටවල් ප්‍රතිශතය |
|---|---|
| 1. දැඩි ස්ථිර අනුපාතික (Hard Peg) | 13.2 |
| i වෙනම වලංගු මුදල් ක්‍රමයක් නැති (No Seperate Legal Tender) | 6.3 |
| ii ව්‍යවහාර මුදල් මණ්ඩල ක්‍රම (Currency Board) | 6.9 |
| 2. මෘදු ස්ථිර අනුපාතික (Soft Peg) | 50.8 |
| i සම්ප්‍රදායික ස්ථාවර අනුපාත රජයන (Conventional Peg) | 23.3 |
| ii ස්ථායි විධිවිධාන (Stabilized Arrengment) | 12.7 |
| iii මන්දගාමී රජයන (Crewling Peg) | 1.6 |
| iv තිරස් සීමා සහිත ස්ථාවර අනුපාත (Peg Rates with Horizontal Bands) | 1.1 |
| v අනෙක් කළමණාකරණ යෙදුම් (Other Management Arrengment) | 1.1 |
| 3. පාවෙන අනුපාතිකය (Floating) | 36.0 |
| i පාවෙන අනුපාතිකය (Floating) | 20.1 |
| ii නිදහස් වල අනුපාතිකය (Free Floating) | 15.9 |

**මූලාශය :** විනිමය අනුපාතික විධිවිධාන යෙදුම් සහ සීමාකිරීම් පිළිබඳ වාර්ෂික වාර්තාව 2010, ජා.මු.අ

**විනිමය අනුපාතයේ ඉතිහාසය**

20 ශතවර්ෂයේ මැද භාගය දක්වා ලෝකයේ බොහෝ රටවල මුදල් වර්ග නිකුත් කරනු ලැබුයේ එම රටවල තිබූ රත්රන් සංචිතවල වටිනාකම පදනම් කරගෙන ය. එ නම් යම් රටක් තම මුදල් නිකුත් කිරීමේ පදනම වූයේ එම රටේ රජයේ සුරක්ෂාගාරවල ඇති රත්රන්වල නියම වටිනාකම මත ය. පළමු ලෝක යුද්ධය සමයේ සමහර රටවල් මෙම රන් ගිණුම් ක්‍රමය නිල නොවන ආකාරයෙන් අත්හැරි නමුත් 1929 සිට නැවත ක්‍රියාත්මක කළහ. 1930 ගණන්වල දී ඇමරිකා එක්සත් ජනපදය රත්රන් අවුන්ස 1 ක රන්සම වටිනාකම ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 35 ක් ලෙස නොවෙනස්ව පවත්වාගෙන යනු ලැබීය. දෙවන ලෝක යුද්ධයෙන් පසු ලෝකයේ බොහෝ රටවල මුදලේ වටිනාකම ඇමරිකා එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ප්‍රකාශ කරන ලදී. මේ නිසා අනෙකුත් රටවල මුදල්වල රන්සම වටිනාකම කොපමණදැයි එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ගණනය කළ හැකි විය. කෙසේ වුව ද පසුකාලීන ව එක්සත් ජනපදයේ ඇති වූ උද්ධමනකාරී බලවේග නිසා අනෙකුත් දියුණු රටවල මුදල් වර්ගවල වටිනාකම ඇමරිකා එක්සත් ජනපද ඩොලරයට වඩා ඉහළ නැගුන අතර වඩාත් ස්ථාවර විය. මෙම බලපෑම නිසා ඇමරිකා එක්සත් ජනපද ඩොලරයේ රන්සම වටිනාකම රත්තරන් අවුන්ස 1 ක් සඳහා ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 70 දක්වා පහළ දැමීමට සිදුවිය. අවසානයේ දී 1971 දී ඇමරිකා එක්සත් ජනපදය රත්රන් සංචිත පදනම මත වූ ඩොලරයේ රන්සම අගය අහෝසි කළ අතර වෙළෙඳපොළ බලවේගවලට එහි වටිනාකම තීරණය වීමට ඉඩහරින ලදී.

1972 න් පසු බොහෝ සංවර්ධිත රටවල් වෙළෙඳපොළ බලවේග මගින් තීරණය වන විනිමය අනුපාත ක්‍රමයක් අනුගමනය කළ ද වර්තමානයේ ද ලෝකයේ බොහෝ රටවල් විවිධ අනුපාතික රජයන අනුගමනය කරනු ලබයි. මෙම විවිධ විනිමය අනුපාතික රජයන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සාමාජික රටවල් ආශ්‍රයෙන් වගුව 1 මගින් දක්වා ඇත.

මෙම සංඛ්‍යා සටහනේ විනිමය අනුපාතික ක්‍රම දක්වා ඇත්තේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සාමාජික රටවල් 186 ක් අනුව කරන ලද වර්ගීකරණයක් පදනම් කරගෙන ය. එම වර්ගීකරණයට අනුව 64% ක් දැඩි හා මෘදු ස්ථිර විනිමය අනුපාතික ක්‍රමයක් අනුගමනය කරන බවත් 36% පාවෙන විනිමය අනුපාත ක්‍රම භාවිත කරන අතර එයින් 16% ක් පමණක් නිදහස් වල විනිමය අනුපාත රජයන භාවිතා කරන බවත් පැහැදිලි වෙයි. බොහොමයක් ලෝක ආර්ථික ක්‍රමයෙන් නිදහස් වෙළෙඳපොළ බලවේග මත ක්‍රියාත්මක වන විනිමය අනුපාත ක්‍රමවලට අවතීර්ණ වෙමින් සිටිය ද මූල්‍ය හෝ ආර්ථික අර්බුද කාලවල දී යම් යම් සීමාවන් පැනවීමට ද ඇතැම් ආර්ථික ක්‍රියාකර ඇත. කෙසේ වුව ද දැඩි ස්ථාවර (Hard Peg) විනිමය අනුපාතික ප්‍රතිපත්ති අනුගමනය කළ බොහෝ රටවල් මෘදු ස්ථිර (Soft Peg) ආනුපාතිකවලට මාරුවීම නිසා අද වන විට එම රටවල් ප්‍රමාණය 51% ක් පමණ වී ඇත.

**ශ්‍රී ලංකාවේ විනිමය අනුපාතික රජයනයේ විකාශය**

නිදහස ලැබීමට පෙර ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්තිය මෙහෙය වූයේ යටත්විජිත ලේකම්, භාණ්ඩාගාරික හා විකණාධිපති යන ත්‍රිපුද්ගල කොමසාරිස් මණ්ඩලයක් මගිනි. මෙම ක්‍රමය යටතේ ශ්‍රී ලංකා රුපියලේ විනිමය අගය තීරණය කෙරුණේ

ඉන්දියානු රුපියලට සමගාමී ව ය. ඒ අනුව මෙම කාලපරිච්ඡේදයේ දී ශ්‍රී ලංකා රුපියලේ අගය ඉන්දියානු රුපියලට සමාන ව පවත්වාගෙන ගිය අතර එය ඉන්දියානු රුපියල හරහා එක්සත් රාජධානි පවුමට සම්බන්ධ කර තිබුනි. මෙම ක්‍රමය යටතේ දේශීය ආර්ථිකයේ අවශ්‍යතාවට වඩා ගෙවුම් ශේෂයේ වෙනස්වීම්වලට අනුව මුදල් නිකුතුවේ උච්චාවචන සිදුවීම, ගෙවුම් ශේෂයේ හිඟයක් ඇති වූ විට ආර්ථිකයේ වර්ධනයට අවශ්‍ය ප්‍රමාණවත් මුදල් සැපයුමක් ඇති නොවීම, රුපියලේ විදේශ අගය තීරණය කිරීමට ස්වාධීනත්වයක් නොමැතිවීම යනාදී හේතු නිසා රටේ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට තිබූ අවකාශ රටේ පැවති විදේශ සංචිත අනුව සීමා වූ බැවින් එය ජාතික ආර්ථිකයේ සංවර්ධනයට අහිතකර ලෙස බලපෑවේ ය. 1950 දී ශ්‍රී ලංකා මහ බැංකුව පිහිටුවීමත් සමඟ මෙම ක්‍රමය අහෝසි කරන ලදී.

එයින් පසු (එනම්,1950 සිට) අනුගමනය කරනු ලැබූ විනිමය අනුපාතික ක්‍රම 2 වන වගුව මඟින් දක්වා ඇත.

## වගුව 2

### ශ්‍රී ලංකාව අනුගමනය කළ විනිමය අනුපාතික ක්‍රම

| විනිමය අනුපාතික ක්‍රමය | ආරම්භක වර්ෂය | විනිමය අනුපාතිකය (එ.ජ. ඩොලරයට රුපියල්. කාල පරිච්ඡේදය අවසානයේදී) | කලින් වර්ෂයට සාපේක්ෂව විනිමය අනුපාතිකයේ සිදු වූ වෙනස % |
|---|---|---|---|
| 1. ස්ථාවර විනිමය අනපාතික ක්‍රමය | 1950 | 4.77 | |
| 2. ද්විත්ව විනිමය අනුපාතික ක්‍රමය | 1968 | 5.93 | 24✪ |
| 3. පාවෙන පාලිත ක්‍රමය | 1977 | 15.56 | 76 |
| 4. පුළුල් පරාසයක දෝලනය වීමට ඉඩදීම | 2000 | 80.06 | 11 |
| 5. පාවෙන විනිමය අනුපාතික ක්‍රමය | 2001 | 93.16 | 16 |

✪ වාර්ෂික සාමාන්‍යය අගයට අනුව

**මූලාශය :** ශ්‍රී ලංකා මහ බංකු වාර්තාව 2010


1950 සිට 1977 දක්වා කාලය තුළ දී දේශීය ආර්ථිකය තුළ පවත්වාගෙන යනු ලැබුයේ ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමයකි. කෙසේ වුව ද අපනයනවල ප්‍රගතිය පහළ යාම නිසා 1967 දී විනිමය අනුපාතිකයේ අගය අඩු (අවප්‍රමාණය) කරන ලදී. ආර්ථිකයේ ආනයන හා අපනයනවල තත්ත්ව ඉහළ දැමීම සඳහා 1968 දී විදේශ විනිමය සහතික පත්‍ර ක්‍රමය ඇතුලත් ද්විත්ව විනිමය අනුපාතික ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මේ යටතේ ගෙවුම් ශේෂ තත්ත්වය යහපත් ව පවත්වා ගැනීමේ අරමුණින් අත්‍යාවශ්‍ය ආනයන හා සාම්ප්‍රදායික නො වූ අපනයන සඳහා පහළ විනිමය අනුපාතිකයකුත් අත්‍යාවශ්‍ය නොවන ආනයන සහ සාම්ප්‍රදායික අපනයන සඳහා ඉහළ විනිමය අනුපාතිකයකුත් පවත්වාගෙන යනු ලැබීය.

ලෝක ආර්ථිකයන්හි ස්ථිර විනිමය අනුපාතය පිළිබඳ වූ බ්‍රෙට්න් වුඩ්ස් (ස්ථිර අනුපාත) ක්‍රමය 1972 දී බිඳ වැටීමත් සමඟ සංවර්ධිත ලෝක ආර්ථිකයන්හි විනිමය අනුපාතික රජයන පාවෙන විනිමය අනුපාතික දෙසට යොමුවිය. ශ්‍රී ලංකාව ද 1977 සිට විවෘත වෙළෙඳපොළ ආර්ථික ක්‍රමයකට අවතීර්ණ විය. ඒ අනුව 1977 සිට ද්විත්ව විනිමය අනුපාතික ක්‍රමය (Dual Exchange Rate System) භාවිතය අහෝසි කළ අතර මූල්‍ය බලධාරීහු පාවෙන පාලිත විනිමය අනුපාතික ක්‍රමයක් (Manage Floating Exchange Rate) හඳුන්වා දුන්හ. 1990 සිට විනිමය අනුපාත සම්බන්ධයෙන් මන්දගාමී සීමා (Crawling Band) රජයනයක් තෝරාගත් අතර ඒ අනුව ශ්‍රී ලංකා විසින් මහ බැංකුව ඩොලරයට සාපේක්ෂව දෛනික ව විනිමය සම්බන්ධ මිල දී ගැනීම් (Buying) සහ විකුණුම් (Selling) අනුපාතික ප්‍රකාශයට පත් කරන ලදී.

විනිමය අනුපාතික සම්බන්ධයෙන් ලෝක ආර්ථිකයන්ට අනුගත වෙමින් නිදහස් වෙළෙඳපොළ බලවේග ක්‍රමයන් අනුගමනය කරමින් 1993 සහ 1994 වර්ෂවල දී ශ්‍රී ලංකා ආර්ථිකය ද විනිමය පාලන සම්බන්ධයෙන් තිබූ බොහෝ සම්බාධක ඉවත් කළේ ය. ඒ අනුව අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ සාමාජික රටවල් සම්බන්ධයෙන් වූ 8 වෙනි වගන්තිය (Article VIII of IMF) පිළිගනිමින් 1994 දී ජාත්‍යන්තර ගනුදෙනු සඳහා වූ ජංගම ගිණුමේ තිබූ සියලු පාලන ඉවත්කරන ලදී. මෙයට අමතරව 1994 සිට ශ්‍රී ලංකා මහ බැංකුව ක්‍රමයෙන් ප්‍රාග්ධන ගිණුමේ ගනුදෙනු ලිහිල් කරමින් විදේශ මුදල් සංචලනයන්ට ඉඩ සැලසුවේ ය. ප්‍රාග්ධන ගිණුම තවදුරටත් ලිහිල් කිරීමේ අරමුණක් වශයෙන් ඒ සඳහා අවශ්‍ය පූර්ව කොන්දේසි ඉටු කිරීමට ද මහ බැංකුව කටයුතු කළේ ය. ඒ අනුව 2000 දී විනිමය අනුපාතිකයට වඩාත් පුළුල් පරාසයක් තුළ තීරණය වීමට ඉඩ දෙන ලදී. මෙම තත්ත්වය තවදුරටත් ලිහිල් කරමින් 2001 ජනවාරි සිට ශ්‍රී ලංකා මහ බැංකුව විනිමය අනුපාතවල මිල දී ගැනීම් හා විකුණුම් අගය ප්‍රකාශයට පත්කිරීම අත්හරිමින් වෙළෙඳපොළ බලවේග මත තීරණය වන පාවෙන විනිමය අනුපාතික ක්‍රමයට එළඹින. කෙ සේ වුව ද විනිමය අනුපාතිකයේ සංචලනය පිළිබඳව දැඩි අවධානයෙන් කටයුතු කරමින් අවශ්‍ය අවස්ථාවල දී වෙළෙඳපොළට මැදිහත්වීමේ ක්‍රියා පිළිවෙත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරනු ලබයි.

2 වන වගුවේ හා රූප සටහනේ දැක්වෙන පරිදි 1950 සිට 1976 දක්වා මූල්‍ය අධිකාරිය ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමයක් අනුගමනය කළ අතර විනිමය අනුපාතිකයේ වෙනස් කිරීමත් සිදුවුයේ මූල්‍ය අධිකාරිය විසින් තීරණය කරනු ලැබූ පරිදි ශ්‍රී ලංකා රුපියලේ අගය අවප්‍රමාණය කිරීමක් හෝ අති ප්‍රමාණය කිරීමත් මත පමණි. මුල් යුගයේ දී මෙම අවප්‍රමාණය හෝ අති ප්‍රමාණය කිරීම් ද සිදුකළ හැකි වුනේ 10% කට අඩුවෙන් පමණකි. එම සීමාව ඉක්මවා සිදුකරනු ලබන වෙනස් කිරීමට අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ සාමාජික රටක් වශයෙන් එහි අනුමැතිය ලබාගැනීමට සිදුවිය. කෙසේ වුව ද රූප සටහන මඟින් පැහැදිලි වන්නේ ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමයක් පැවති සමයේ විනිමය අනුපාතිකය දැඩි ලෙස වෙනස්කම්වලට ලක් කර නැති බවයි. මේ නිසා ම මෙම කාලපරිච්ඡේදය තුළ දී රටේ මුදල් සැපයුම සම්බන්ධයෙන් තීරණ ගැනීමට හා අපනයන ප්‍රවර්ධන සඳහා අයහපත් වාතාවරණයක් ඇතිවීමෙන් ජාතික ආර්ථිකයේ සංවර්ධනය හා ආර්ථික වර්ධනයේ අඩුවක් දක්නට ලැබුනි. එහෙත් මිල මට්ටමේ දැඩි වෙනස්වීම් සීමාවීම නිසා උද්ධමනකාරී බලවේගවල අඩුවක් දක්නට ලැබුනි. අපනයනවල ප්‍රගතිය අඩුවීම නිසා ම 1967 දී විනිමය අනුපාතිකය අවප්‍රමාණය කිරීමටත් 1968 දී ද්විත්ව අනුපාතික ක්‍රමයකට යාම තුළින් විනිමය අනුපාතිකයේ වෙනස්කම් කිරීමට එවකට පැවති රජය කටයුතු කළේ ය.

රූප සටහන 1
ශ්‍රී ලංකාවේ විනිමය අනුපාතික රජයනයේ විකාශය




**මූලාශය :** ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 2010

1977 සිට ආරම්භ කළ විවෘත වෙළෙඳපොළ ආර්ථික ක්‍රමයත් සමග විනිමය අනුපාතිකය ඉතා විශාල ලෙස (76%) අවප්‍රමාණය වූ අතර 1977 සිට පාලිත පාවෙන විනිමය අනුපාතික ක්‍රමයක් යටතේ විනිමය අනුපාතිකය දිගට ම වෙනස්වීම්වලට ලක්විය. රූප සටහනට අනුව 1977 සිට 2000 දක්වා කාලපරිච්ඡේදය තුළ මෙම වෙනස්කම් නිසා දිගට ම විනිමය අනුපාතිකයේ අඩුවීමක් නිරූපනය වෙයි. 2000 වර්ෂයේ දී විනිමය අනුපාතිකය පුළුල් පරාසයක දෝලනය වන්නට ඉඩ දීම ද එම වර්ෂය තුළ දී විනිමය අනුපාතිකයේ අගය දැඩි ලෙස අඩුවීමට බලපෑ අතර 2001 දී පාවෙන විනිමය ක්‍රමයකට එළඹීමත් සමග එම වර්ෂය තුළ දී සමපේක්ෂණ බලපෑම් නිසා විනිමය අනුපාතිකය දැඩි ලෙස අවප්‍රමාණය විය. එහෙත් ශ්‍රී ලංකා මහ බැංකුව දේශීය විනිමය වෙළෙඳපොළට මැදිහත් වීම සහ දැඩි විචලනය පාලනයට ගත් ක්‍රියාමාර්ග නිසා ටික කලක දී විනිමය අනුපාතිකය ස්ථාවර තත්ත්වයකට පත්විය.

## විදේශ විනිමය ගනුදෙනු සම්බන්ධ ව්‍යාපාරික පැතිකඩ

විදේශ විනිමය අනුපාතිකය තීරණය වීම සඳහා රටවල් අතර ඇතිවන වෙළෙඳ හා ආයෝජන ගනුදෙනු සෘජුව ම බලපාන්නේ ය. විනිමය අනුපාතිකය තීරණය වන්නේ සාධක ගණනාවක බලපෑමෙනි. ඒ ඒ රටවල ආර්ථික ස්ථායිතාව, වෙළෙඳ හා මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් ඇති නිදහස, ජාත්‍යන්තර රාජ්‍ය සීමා හරහා ප්‍රාග්ධනය ගලායාමේ ලිහිල් බව, මූල්‍ය ප්‍රතිපත්තිමය තීරණවලට දී ඇති ප්‍රමුඛතාව සහ දේශීය හා විදේශීය වශයෙන් ආර්ථික සංවර්ධනය සම්බන්ධයෙන් රටවල් අතර ජනතාව ගේ ඇති අපේක්ෂා යනාදිය විනිමය අනුපාතිකය තීරණය වීමට බලපාන මූලික සාධක කිහිපයකි. විනිමය අනුපාතිකය යන්න විදේශ මුදල් සම්බන්ධයෙන් ආර්ථිකයක පවතින මිල ලෙස ද පැහැදිලි කළ හැකිය. මේ නිසා විනිමය වෙළෙඳපොළට සහභාගිවන්නෝ විනිමය අනුපාතිකයේ හැසිරීම පිළිබඳව දැඩි අවධානයකින් කටයුතු කරති. සංචාරකයෝ, වානිජ බැංකු, මහ බැංකු හා බහු ජාතික ආයෝජකයෝ ආදී වශයෙන් වන විවිධ ගනුදෙනුකරුවෝ විශාල පිරිසක් මේ අතර වෙති. බොහෝ වෙළෙන්දෝ ලාභ ලැබීමේ පරමාර්ථයෙන් විනිමය අනුපාතික සංචලන සමපේක්ෂණය කරති. එ නම් විනිමය අනුපාතිකවල සිදුවිය හැකි වෙනස්කම් මත ලාභ ලැබීමේ චේතනාවෙන් ඉදිරියේ දී මිල ගණන් ඉහළ යන වත්කම් මිල දී ගැනීම, මිල අඩු මුදල් වර්ග මිලට ගෙන විකිණීමෙන් ලාභ ලැබීම යනාදී ක්‍රියාවල යෙදෙති. විනිමය අනුපාත වෙනස් වේ ය යන අපේක්ෂාව පෙරදැරි ව ලාභ ලැබීමේ පරමාර්ථයෙන් කෙටි කාලීන ව මුදල් වර්ග රඳවා ගැනීම, ආයෝජන කළඹ වෙනස්කිරීම මෙන් ම විනිමය අනුපාතික සංචලන නිසා විනිමය අනුපාතික ගනුදෙනු හරහා ඇතිවිය හැකි අවදානම් කළමනාකරණය සඳහා ව්‍යුත්පන්න භාවිතා කිරීම යනාදිය විනිමය වෙළෙඳපොළ සහභාගිවන්නන් ගේ කටයුතු වේ. මොවුන්ගෙන් සමහරු හරස් විනිමය අනුපාතිකවල වෙනස්කම් ප්‍රයෝජනයට ගනිමින් පරස්පර ලාභ ලබන්නෝ (Arbitrageurs), එ නම් මිල අඩු වෙළෙඳ පොළෙන් මිලට ගෙන මිල වැඩි වෙළෙඳපොළේ විකිණීම තුළින් අවදානමකින් තොර ව ලාභ ලබන්නන් ලෙස කටයුතු කරති. රටවල් දෙකක් අතර එක් එක් රටේ මුදල් වර්ගය අනෙක් රටේ මුදල් වර්ගයට සාපේක්ෂව නිල වශයෙන් විනිමය අනුපාතයක් ලෙස ප්‍රකාශයට පත්කර නැති මුදල් වර්ග දෙකක් අතර හුවමාරු අනුපාතය යි. උදහරණයක් ලෙස ශ්‍රී ලංකා රුපියල හා ඉන්දියානු රුපියල එම මුදල් වර්ගවලට සාපේක්ෂව

නිල වශයෙන් විදේශ විනිමය වෙළෙඳපොළේ මිල කතනය කර නොමැත. එහෙත් මෙම මුදල් වර්ග දෙක ම ඇමෙරිකා එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව මිල කතන කර ඇති නිසා හරස් අනුපාතිකය වන්නේ (LKR/USD) x (USD/INR) වේ. කෙසේ වුව ද වෙළෙඳපොළේ මිල අඩු මුදල් වර්ග සඳහා ඉල්ලුම ඉහළ යාමෙන් ද මිල වැඩි වෙළෙඳපොළේ සැපයුම ඉහළ යාම මගින් ද මෙම පරස්පර ලාභ අහෝසි වන තෙක් ඔවුන්ට කටයුතු කළ හැකිය.

විනිමය වෙළෙඳපොළේ ලාභ අපේක්ෂාවෙන් කටයුතු කරන අනෙකුත් පාර්ශ්ව වන්නේ සමපේක්ෂකයෝ (Speculators) හා ඉදිරි රැකුම් භාවිතා කරන්නෝ (Hedgers) ය. මොවුන් කටයුතු කරන්නේ විදේශ විනිමය වෙළෙඳපොළට බලපාන විවිධ සාධක අධ්‍යයනය කිරීමෙන් අනතුරුව ය. විනිමය අනුපාතිකයේ සිදුවන සංචලන නිසා තම ආයෝජන කළඹේ ඇතිවිය හැකි අවදානම් කළමනාකරණය සඳහාත් ලාභ ලැබීමේ පරමාර්ථයෙනුත් විදේශ විනිමය වෙළෙඳපොළේ සහභාගිවන්නෝ ව්‍යුත්පන්න ගනුදෙනුවල යෙදෙති.

මූල්‍ය වෙළෙඳපොළ ප්‍රධාන වශයෙන් හුවමාරු පදනම් වූ වෙළෙඳපොළ හා කවුන්ටරයෙන් ගනුදෙනුවන වෙළෙඳපොළ ලෙස ක්‍රියාත්මක වේ. කවුන්ටරයෙන් ගනුදෙනුවන බොහෝ වෙළෙඳපොළ එතැන් (Spot) හා මුදල් (Money) වෙළෙඳපොළ ය. කවුන්ටරයෙන් ගනුදෙනුවන ලෝකයේ විශාලතම වෙළෙඳපොළ වන්නේ විදේශ විනිමය වෙළෙඳපොළ ය. නිල වශයෙන් සාමාජිකත්වයක් එහි නැතත්, බැංකු, දුරකථන, ෆැක්ස් හා විද්‍යුත් මාර්ග ඔස්සේ ඒවායේ ගනුදෙනු සිදු වේ. මේවායේ නියාමනය එක් එක් රටේ නියාමකයන් විසින් සිදු කරනු ලබන අතර ජාත්‍යන්තර පියවීම් බැංකුව (BIS- Bank for International Settlements) ද මැදිහත්ව ක්‍රියාකරයි. මිල කථන වෙළෙන්දෝ ද විදේශ විනිමය වෙළෙඳපොළට මැදිහත් ව කටයුතු කරති. වෙළෙඳපොළ නියෝජිතයන් මාර්ගයෙන් ඔවුහු තම කවුන්ටර මිල ගණන් ලබාදෙති. මෙම මිල ගණන් මත විදේශ විනිමය වෙළෙඳපොළ තුළ විශාල ලෙස ව්‍යුත්පන්න ගනුදෙනු සිදුවන බව ද මෙහි දී සඳහන් කළ යුතු ය.

ආර්ථිකයක් තුළ මෙ ලෙස විනිමය අනුපාතිකයේ වෙනස්වීම් ඍජුව ම විදේශ විනිමය වෙළෙඳපොළ සහභාගිවන්නන්ට බලපායි. විශේෂයෙන් ම දේශීය මුදලේ අගය ශක්තිමත්වීම (Appreciation of Exchange Rate), එ නම් විදේශීය මුදල් ඒකකයක් මිල දී ගැනීම සඳහා අද ගෙවිය යුතු දේශීය මුදල් ඒකක ගණන පෙර පැවැති ප්‍රමාණයට වඩා අඩුවීම නිසා දේශීය ආර්ථිකය ආනයන සඳහා කළ යුතු ගෙවීම් අඩුවීමටත් විනිමය අනුපාතික ස්ථාවර වීමටත් හේතු වේ. අනෙක් අතට විදේශීය මුදල් වර්ගයකට සාපේක්ෂව ගෙවිය යුතු දේශීය මුදලේ ඒකක ගණන වැඩිවීම දේශීය මුදලේ අගය අවප්‍රමාණය වීමක් (Depreciation of Exchange Rate) වන අතර මෙම තත්ත්වය අපනයනකරුවන්ට කෙටිකාලයේ දී වාසි සහගත වන නමුත් දිගින් දිගට ම සිදුවන දේශීය මුදලේ අගය ක්ෂය වීමක් දේශීය මිල මට්ටම් ඉහළ යාමට ආනයන වැඩිවීමට හා ගෙවුම් ශේෂ ගැටලු ඇතිකිරීමටත් හේතු විය හැකි ය. විදේශ විනිමය අනුපාතික උච්චාවචනවලින් ඇතිවිය හැකි අවදානම් කළමනාකරණය සඳහා විවිධ ව්‍යුත්පන්න භාවිතා කිරීමට විදේශ විනිමය වෙළෙඳපොළ සහභාගිවන්නෝ කටයුතු කරති. (විදේශ විනිමය ව්‍යුත්පන්න පිළිබඳව ඉදිරි කලාපයක දී සාකච්ඡා කරනු ඇත)

## විදේශ විනිමය ගනුදෙනුවල ආර්ථික වැදගත්කම

රටක ආර්ථික සංවර්ධන මට්ටම, මූල්‍ය හා මූල්‍ය වෙළෙඳපොළ ස්ථායිතාව, පහළ හා ස්ථායි උද්ධමන මට්ටම් හා යහපත් ගෙවුම් ශේෂ තත්ත්වයන් ස්ථාවර විනිමය අනුපාතයක් පවත්වාගැනීමට යෝග්‍ය පරිසරය ගොඩ නගනු ලබයි. ඕනෑ ම ආර්ථිකයක ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්ති අතර විනිමය කළමනාකරණ ප්‍රතිපත්තිය ද ප්‍රතිපත්ති සම්පාදකයන් ගේ හා

**වගුව 3**

**ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂය - 1990 සිට**

(තෝරාගත් වර්ෂ කිහිපයක් සඳහා)

ඇ.එ.ජ.ඩොලර් මිලියන

| | 1990 | 2000 | 2005 | 2007 | 2008 | 2009 | 2010 |
|---|---|---|---|---|---|---|---|
| වෙළඳ ශේෂය | (-702) | (-1798) | (-3370) | (-3657) | (-5981) | (-3122) | (-5205) |
| ජංගම ගිණුම් ශේෂය | (-377) | (-1066) | (-1499) | (-1402) | (-3886) | (-214) | (-1418) |
| ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුමේ ශේෂය | 514 | 443 | 1808 | 2097 | 1773 | 2594 | 2876 |
| සමස්ත ශේෂය | 119 | -522 | 204 | 531 | -1385 | 2725 | 921 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස වෙළඳ ගිණුමේ ශේෂය | -8.8 | -10.8 | -11.9 | -11.3 | -14.7 | -7.4 | 10.5 |
| ජංගම ගිණුමේ ශේෂය | -4.7 | -6.4 | -5.3 | -4.3 | -9.5 | -0.5 | -2.9 |

**මූලාශ්‍රය :** ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 2010

තීරකයන් ගේ දැඩි අවධානයට ලක් වේ. විනිමය අනුපාතිකයේ දැඩි වෙනස්වීම් වෙළෙඳපොළ අස්ථායිවීමට හා ආර්ථික ප්‍රතිවිපාක ඇතිවීමට පාදක වන බැවින් ප්‍රතිපත්ති සම්පාදකයෝ දේශීය ආර්ථිකය තුළ විනිමය අනුපාතිකය ස්ථාවර ව පවත්වාගැනීමට කටයුතු කරති. එ මෙන් ම ආර්ථිකයක ප්‍රධාන විදේශීය වෙළෙඳ හවුල්කරුවන් ගේ මුදල් වර්ගවලට සාපේක්ෂව ඉලක්ක බිහිකිරීම ගෙවුම් ශේෂයේ ප්‍රමාණයන්ට බලපෑම් කිරීම මූලික පරමාර්ථ විය හැකි ය.

ආර්ථිකයක විදේශ විනිමය ගනුදෙනුවල වැදගත්කම විදහා පානුයේ එම ආර්ථිකයේ ගෙවුම් ශේෂ ගිණුම් මගින් ය. විශේෂයෙන් ම රටක ජාත්‍යන්තර ද්‍රවශීලතාව පිළිබඳ අවබෝධයක් ජංගම ගිණුමේ තත්ත්වය තුළින් පැහැදිලි වේ. රටක වත්මන් විදේශ වියදම් එහි වත්මන් විදේශ ආදායම්වලින් ගෙවා දැමීමට ඇති හැකියාව ජංගම ගිණුම මගින් පැහැදිලි කරයි. ජංගම ගිණුමේ අතිරික්තයක් හෝ තුලනය වීමේ තත්ත්වයක් හෝ පැවැතීම විදේශ ගනුදෙනු සම්බන්ධ යහපත් ලක්ෂණයකි.

අනෙක් අතට ජංගම ගිණුමේ හිඟයක අවාසිදායක තත්ත්වය තීරණය වන්නේ හිඟයේ ප්‍රමාණය හා හිඟය පවතින කාලපරිච්ඡේදය, එ නම් දිගින් දිගට ම දැඩි හිඟයක් පැවතීම අනුව ය. කෙටිකාලීන හිඟයක් පීඩාකාරී එකක් නොවන්නේ සංචිත පහළ දැමීමෙන් හෝ ප්‍රාග්ධන ගලා ඒම් තුළින් හෝ එය පහසුවෙන් මූල්‍යනය කළ හැකි බැවිනි. එහෙත් ජංගම ගිණුමේ හිඟයේ ප්‍රමාණ ඉහළ අගයක් ගැනීම හා හිඟය අනාගතයේදීත් පවතිනු ඇතැයි බලාපොරොත්තු වුවහොත් එහි ප්‍රතිඵල ආර්ථිකයට වඩාත් හානිකරවිය හැකි ය. හිඟයේ කාලය වැඩිවන තරමට නිල සංචිත පහළ වැටීම හෝ විදේශ ණය ගැනීම් වැඩිවීම ණයෙහි ප්‍රමාණය වැඩි වූ විට ණය සේවාකරණ පිරිවැය වැඩිවීම විදේශ විනිමය වෙළෙඳපොළට හා විනිමය අනුපාතිකයට අහිතකර ලෙස බලපානු ඇත. අනෙක් අතට ණයගැති රට පිළිබඳ විශ්වාසය අඩුවීම හේතුවිය හැකි අතර ආයෝජන අරමුදල් රටින් පිටට ගලායාම වැළැක්වීමට පොලී අනුපාතික ඉහළ දැමීමට සිදුවීම හෝ විනිමය අනුපාතිකයේ අගය අඩුකිරීම තුළින් හිඟය පියවාගැනීමට කටයුතු කිරීමට ඉඩ තිබේ.

ජංගම ගිණුමේ අතිරික්ත නිල සංචිත ඉහළ දැමීමටත්, ණය ගෙවා දැමීමට හා විදේශීය ආයෝජන නැංවීමට යොදාගත හැකි නිසා ජංගම ගිණුමේ අතිරික්තයක් නිතරම වාසිදායක ලක්ෂණයකි. එ මෙන් ම ජංගම ගිණුමේ යහපත් තත්ත්වය විදේශීය ආයෝජනයන්ගේ විශ්වාසය ඉහළ යාමටත් විදේශීය ආයෝජන ගලා ඒමටත් රටක සෛවරීත්ව ශ්‍රේණි ගතකිරීම්වල ඉහළ යාමටත් හේතු වේ.

තෝරාගත් වර්ෂ කිහිපයක් සඳහා වූ ගෙවුම් ශේෂයේ තත්ත්වය වගුව 3 මගින් ඉදිරිපත් කර ඇත. ජංගම ගිණුමේ ප්‍රධාන කොටසක් වන වෙළෙඳ ගිණුම (අපනයන/ආනයන) දිගින් දිගට ම හිඟයක් වාර්තා කර ඇති නමුත් මෑත කාලීන වර්ෂවල දී සංක්‍රාම ගිණුමේ අතිරික්තය තුළින් එම හිඟය බොහෝදුරට සමනය කරමින් ජංගම ගිණුමේ හිඟ ශේෂය දැරිය හැකි මට්ටමකට පත් වී ඇත. උදාහරණයක් ලෙස 2010 වර්ෂයේ වෙළෙඳ ශේෂයේ හිඟය එක්සත් ජනපද ඩොලර් මිලියන 5205 ක් වී ඇති අතර සංක්‍රාම ගිණුමේ වූ අතිරික්තය නිසා ජංගම ගිණුමේ හිඟය එක්සත් ජනපද ඩොලර් මිලියන 1418 නැතහොත් දළ ජාතික නිෂ්පාදිතයෙන් 2.9% ක් පමණ අගයක් ගෙන ඇත. ජංගම ගිණුමේ පහළ මට්ටමක කෙටිකාලීන හිඟයත් ආර්ථිකයකට එ තරම් පීඩාකාරී නොවන බව ඉහත පැහැදිලි කර ඇත.

ආර්ථිකයක තුලනය වූ ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුමක් පැවතියත් එය ඉතා ඉක්මනින් වෙනස්වන කෙටිකාලීන ප්‍රාග්ධන ගලා ඒම් හෝ ප්‍රාග්ධන ගලායාම් මත රැඳී තිබීමට හැකි ය. පොලී අනුපාතිකවල වෙනස්වීම් ආර්ථික හා මූල්‍ය අර්බුද ප්‍රාග්ධන ගිණුම්වල තත්ත්වයන් සීඝ්‍රයෙන් වෙනස්වීමට හේතුවිය හැකි ය.

ප්‍රාග්ධන ගිණුමේ හිඟයකින් පැහැදිලි කරන්නේ අරමුදල් ශුද්ධ ලෙස පිටතට ගලායාමකි. එහෙත් ප්‍රාග්ධන ගිණුමේ හිඟය ජංගම ගිණුමේ හිඟය තරම් බරපතල නො වන්නේ හිඟය ඇතිවුනේ එම රට විදේශීය ප්‍රාග්ධන ආයෝජන කිරීම නිසා නම් අනාගතයේ දී පොලී හා ලාභ ගලා ඒම ජංගම ගිණුමේ තත්ත්වය ඉහළ යාමට හේතු වේ.

අනෙක් අතට ප්‍රාග්ධන ගිණුමේ අතිරික්තය ඇතිවුනේ විදේශිකයන් ගේ දිගුකාලීන ආයෝජනවලින් නම් එය දේශීය භාණ්ඩ නිෂ්පාදනයටත් අපනයන ඉහළ යාමටත් ආනයන අඩු කිරීමටත් ජීවන මට්ටම් ඉහළ යාමටත් හේතු වේ. කෙසේ වුව ද අනාගතයේ දී ප්‍රාග්ධනය ඉවත් කර ගැනීම හා පොලී හා ලාභාංශ පිටට ඇදී යාටමත් ඉඩ ඇති බැවින් එ විට ජංගම ගිණුමට බලපෑම් ඇතිවිය හැකි ය.

ගෙවුම් ශේෂ ගැටලු ඇතිවන විට ඒවා තුලනය කර ගැනීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයෝ විවිධ ප්‍රතිකර්ම යොදති. මේවා අතර විනිමය අගය අඩුකිරීම, ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්ති, අපනයන භාණ්ඩ තත්ත්ව වර්ධනය හා සමහර අවස්ථාවල දී ඍජු පාලන හා විනිමය පාලන ආදී පිළියම් වෙයි.

මේ අනුව පැහැදිලිවන්නේ විදේශ විනිමය ගනුදෙනුවල ව්‍යාපාරික හා ආර්ථික පැතිකඩ සංරචක ගණනාවක් අනුව තීරණය වන බවත් ඒවායේ ක්‍රියාකාරීත්වය විනිමය අනුපාතිකය තීරණය වීමටත් බලපාන බවයි.✪

# පාවෙන විනිමය අනුපාතික ක්‍රමය

**තිලක් රංජීව ප්‍රියදර්ශන**

සහකාර අධ්‍යක්ෂ, මූල්‍ය පද්ධති ස්ථායිතා දෙපාර්තමේන්තුව

**විදේශ විනිමය අනුපාතිකය හැඳින්වීම**

විනිමය අනුපාතය වශයෙන් හැඳින්වෙන්නේ විදේශීය මුදල් ඒකකයක් සහ දේශීය මුදල් ඒකකයක් අතර පවත්නා අනුපාතය ය. නැතහොත් විදේශීය මුදල් ඒකකයක් දේශීය මුදල් ඒකකයක් සමග හුවමාරු වන අනුපාතය ය. දේශීය මුදල් ඒකකයකින් මිල දී ගත හැකි විදේශ මුදල් ඒකක සංඛ්‍යාවත් විදේශීය මුදල් ඒකකයකින් මිල දී ගත හැකි දේශීය මුදල් සංඛ්‍යාවත් විදේශ විනිමය අනුපාතයෙන් ප්‍රකාශ කෙරේ.

$$\textbf{විනිමය අනුපාතය} = \frac{\textbf{විදේශ මුදල් ඒකකයේ වටිනාකම}}{\textbf{දේශීය මුදල් ඒකකයේ වටිනාකම}}$$

විනිමය අනුපාතිකය මගින් විදේශීය මුදල් ඒකකයක දේශීය අගය මැනිය හැකි සේ ම, දේශීය මුදල් ඒකකයක විදේශීය වටිනාකම ද සෙවිය හැකි ය. උදාහරණ ලෙස ඇමෙරිකා එක්සත් ජනපද ඩොලරයක් (US$) මිල දී ගැනීම සඳහා ශ්‍රී ලංකා රුපියල් (LKR) 110 ( = LKR 110/ US$1) ක් ගෙවිය යුතු අතර ශ්‍රී ලංකා රුපියලක් මිල දී ගැනීම සඳහා US$ 0.009 (= US$ 1/ LKR 110) ක් ගෙවිය යුතු ය. දේශීය මුදලේ විදේශීය අගය හෙවත් විනිමය අනුපාතිකය ඒ ඒ විදේශ මුදල් වර්ගවලට අදාළ ව වෙනස් වේ. බ්‍රිතාන්‍ය පවුමක ශ්‍රී ලංකා රුපියල් වටිනාකම, ජපන් යෙන් එකක ශ්‍රී ලංකා රුපියල් වටිනාකම, ඉන්දියන් රුපියලක ශ්‍රී ලංකා රුපියල් වටිනාකම, යුරෝ එකක ශ්‍රී ලංකා රුපියල් වටිනාකම යන මේවා එකිනෙකට වෙනස් නිදසුන් ලෙස පෙන්විය හැකි ය.

**විවිධ විදේශ විනිමය අනුපාතික ක්‍රම**

අතීතයේ සිට මේ දක්වා ඒ ඒ රටවල් විවිධ විනිමය අනුපාතික ක්‍රම භාවිතා කරනු ලබයි. ඒවායේ වැදගත්කම කාලානුරූප ව වෙනස් වූ අතර එ ලෙසින් යොදා ගැනුණු ප්‍රධාන විනිමය අනුපාතික ක්‍රම කිහිපයක් පහතින් දැක්වෙයි.

(1) රන් මිනුම් ක්‍රමය
(2) රන් හුවමාරු මිණුම් ක්‍රමය
(3) නම්‍ය (පාවෙන) විනිමය අනුපාතික ක්‍රමය
(4) ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමය
(5) පාලිත විනිමය අනුපාතික ක්‍රමය

සංඛ්‍යා සටහන 1

**වර්ෂාවසානයේ දී විනිමය අනුපාතික: 2000 සිට 2010**
(විදේශ මුදල් ඒකකයකට ශ්‍රී ලංකා රුපියල්)

| රට | මුදල | වසර | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2000 | 2001 | 2002 | 2003 | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 |
| ඕස්ට්‍රේලියාව | ඩොලර් | 44.34 | 47.56 | 54.72 | 72.49 | 81.54 | 74.70 | 85.22 | 95.58 | 78.05 | 101.99 | 112.88 |
| කැනඩාව | ඩොලර් | 53.34 | 58.62 | 61.39 | 74.75 | 86.87 | 87.75 | 92.83 | 111.01 | 92.76 | 109.29 | 11.90 |
| යුරෝපා සංගමය | යූරෝ | 74.32 | 82.27 | 101.38 | 121.60 | 142.32 | 120.96 | 141.58 | 160.27 | 159.45 | 163.72 | 147.56 |
| හොං කොං | ඩොලර් | 10.26 | 11.95 | 12.40 | 12.46 | 13.45 | 13.17 | 13.86 | 13.94 | 14.60 | 14.75 | 14.26 |
| ඉන්දියාව | රුපියල් | 1.71 | 1.93 | 2.02 | 2.12 | 2.40 | 2.27 | 2.44 | 2.77 | 2.36 | 2.46 | 2.48 |
| ජපානය | යෙන් | 0.70 | 0.71 | 0.82 | 0.90 | 1.02 | 0.87 | 0.91 | 0.97 | 1.25 | 1.24 | 1.36 |
| දකුණු කොරියාව | වොන් | 0.06 | 0.07 | 0.08 | 0.08 | 0.10 | 0.10 | 0.12 | 0.12 | 0.09 | 0.10 | 0.10 |
| සිංගප්පූරුව | ඩොලර් | 46.18 | 50.35 | 55.78 | 56.86 | 63.98 | 61.32 | 70.21 | 75.37 | 78.60 | 81.32 | 86.14 |
| එක්සත් රාජධානිය | පවුම් | 119.37 | 135.06 | 155.12 | 172.20 | 201.37 | 175.94 | 211.29 | 217.15 | 163.28 | 181.75 | 171.41 |
| එක්සත් ජනපදය | ඩොලර් | 80.06 | 93.16 | 96.73 | 96.74 | 104.61 | 102.12 | 107.71 | 108.72 | 113.14 | 114.38 | 110.95 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

**පාවෙන විනිමය අනුපාතික ක්‍රමය**

බොහෝ රටවල් වර්තමානයේ දී පාවෙන විනිමය අනුපාතික ක්‍රමය භාවිතා කරයි. ජපානය, යුරෝ කලාපය, ඇමෙරිකා එක්සත් ජනපදය, සිංගප්පූරුව, මහා බ්‍රිතාන්‍යය, පිලිපීනය, සවුදි අරාබිය, බ්‍රසීලය, චිලී, නයිජීරියාව සහ කොලොම්බියාව පාවෙන විනිමය අනුපාතික ක්‍රමය භාවිතා කරන රටවල් සඳහා උදාහරණ වෙයි. පාවෙන විනිමය අනුපාතික ක්‍රමය යනු විදේශ විනිමය වෙළෙඳපොළේ විදේශ විනිමය ඉල්ලුම් හා සැපයුම් බලවේග මත විනිමය අනුපාතිකය නිදහසේ තීරණය වීමට ඉඩ දීම ය. ශ්‍රී ලංකා රුපියල ද ඇමෙරිකා එක්සත් ජනපද ඩොලරය ද අතර විනිමය අනුපාතිකය තීරණය වන්නේ ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර්වලට ශ්‍රී ලංකාව තුළ ඇති ඉල්ලුමත් සැපයුමත් මත ය. ශ්‍රී ලංකා රුපියල ද බ්‍රිතාන්‍ය පවුම ද අතර විනිමය අනුපාතය තීරණය වන්නේ බ්‍රිතාන්‍ය පවුම්වලට ශ්‍රී ලංකාව තුළ ඇති ඉල්ලුමත් සැපයුමත් මත ය. පාවෙන විනිමය අනුපාතික ක්‍රමයක විනිමය අනුපාතය නිතර ම සමතුලිත ව පවතී. එ නම්, සැම විට ම විදේශ විනිමය ඉල්ලුම හා සැපයුම සමාන මට්ටමක පවතී. එ බැවින් විදේශ විනිමය වෙළෙඳපොළක විදේශ විනිමය ඉල්ලුම හා විදේශ විනිමය සැපයුම සමතුලිත මට්ටමක පවතින බැවින් විදේශ විනිමය හිඟයක් නොමැති අතර එමගින් ගෙවුම් ශේෂ ගැටලු නිරාකරණය කරන යාන්ත්‍රණයකට ද මග පෑදෙයි.


**විදේශ විනිමය ඉල්ලුම**

විදේශ විනිමය වෙළෙඳපොළක විදේශ විනිමය සඳහා ඉල්ලුමක් ඇතිවනුයේ භාණ්ඩ හා සේවා ආනයනය, විදේශ රටවල කෙරෙන ආයෝජන, විදේශ රටවල කෙරෙන සංචාර හා අධ්‍යාපන කටයුතු යනාදී විදේශ විනිමය ඉල්ලුම් සාධක තුළිනි. උදාහරණයක් ලෙස ශ්‍රී ලංකාවේ පුද්ගලයෙක් ඇමරිකාවෙන් භාණ්ඩ හා සේවා ආනයනය කළ විට ඒ සඳහා ඩොලර්වලින් මුදල් ගෙවිය යුතු ය. එ නම් ශ්‍රී ලංකාවේ පුද්ගලයා රුපියල් විදේශ විනිමය වෙළෙඳපොළට සපයා ඩොලර් මිල දී ගෙන ඇමරිකාවට ඩොලර්වලින් මුදල් ගෙවයි.

විදේශ රටකින් භාණ්ඩ මිලට ගැනීම සඳහා ගෙවීම් කළ යුත්තේ එම රට පිළිගන්නා මුදල්වලිනි. ඒ සඳහා දේශීය මුදල් විදේශ මුදල්වලට පරිවර්තනය කිරීම හේතුවෙන් විදේශ මුදල් සඳහා ඉල්ලුමක් ඇති වේ. විදේශ රටවලට කෙරෙන කළඹ ආයෝජන ද සෘජු විදේශ ආයෝජන ද සඳහා අවශ්‍ය විදේශ මුදල් ලබා ගැනෙන්නේ දේශිය මුදල් විදේශීය මුදල්වලට පරිවර්තනය කිරීමෙනි. එයින් ද විදේශ විනිමය ඉල්ලුමක් ඇති වේ. විදේශ රටවල කෙරෙන සංචාර සහ අධ්‍යාපනය සඳහා අවශ්‍ය විදේශ මුදල් ලබා ගන්නේ දේශීය මුදල් එ කී විදේශ මුදල් සඳහා හුවමාරු කර ගැනීමෙනි. එහි දී ද විදේශ විනිමය සඳහා ඉල්ලුමක් ඇති වේ.

විදේශ විනිමය සඳහා ඉල්ලුම් ප්‍රමාණය තීරණය වනුයේ විදේශ විනිමය ඒකකයක මිල මත ය. එ නම් විදේශ මුදල් ඒකකයක් සඳහා ගෙවිය යුතු දේශීය මුදල් ප්‍රමාණය මත ය. උදාහරණයක් වශයෙන් එක්සත් ජනපද ඩොලර් සඳහා ශ්‍රී ලංකාවේ පවතින ඉල්ලුම සළකා බැලිය හැකි ය. එය රඳා පවතින්නේ එක්සත් ජනපද ඩොලර් එකක් සඳහා ගෙවිය යුතු ශ්‍රී ලංකා රුපියල් ප්‍රමාණය මත ය. විදේශ විනිමය ඒකකයක මිල වැඩිවීමත් සමග විදේශ විනිමය ඉල්ලුම් ප්‍රමාණය අඩු විය හැකි ය. එ සේ ම, විදේශ විනිමය ඒකකයක මිල අඩුවීමත් සමග විදේශ විනිමය ඉල්ලුම් ප්‍රමාණය වැඩි වේ. උදාහරණයක් ලෙස එක්සත් ජනපද ඩොලරයක රුපියල් මිල වැඩිවීමත් සමග ඒ සඳහා වන ඉල්ලුම අඩුවන අතර ඩොලරයක මිල අඩුවීමත් සමග ඩොලර් සඳහා කරන ඉල්ලුම වැඩි වේ. මෙම තත්ත්වය සාමාන්‍ය භාණ්ඩයක ඉල්ලුම් වක්‍රය දක්වන අකාරයට ම වමේ සිට දකුණට බෑවුම්වන වක්‍රයකින් දැක්විය හැකි ය. 1 වන රූප සටහනෙහි DD මගින් විදේශ විනිමය සඳහා වන ඉල්ලුම් වක්‍රය පෙන්නුම් කෙරේ.

රූප සටහන 1
විදේශ විනිමය වෙළෙඳපොළේ විදේශ විනිමය සඳහා ඉල්ලුම් වක්‍රය





**විදේශ විනිමය සැපයුම**

භාණ්ඩ හා සේවා සඳහා කෙරෙන අපනයන, විදේශ ආයෝජන ගලා ඒම, විදේශ සංචාරකයන් ගේ පැමිණීම සහ විදේශ රටවලින් කෙරෙන සංක්‍රාම ලැබීම් යනාදිය හේතුවෙන් විදේශ විනිමය සැපයුමක් ඇති වේ. උදාහරණයක් ලෙස ශ්‍රී ලංකාවේ පුද්ගලයකු ඇමරිකාවට භාණ්ඩ හා සේවා අපනයනය කිරීම නිසා ඔහුට ඩොලර්වලින් මුදල් ලැබෙන අතර ඒවා ශ්‍රී ලංකාව තුළ භාණ්ඩ හා සේවාවලට හුවමාරු කළ නො හැක. එම නිසා එම මුදල් විදේශ විනිමය වෙළෙඳපොළට විකුණා ඊට සමාන වටිනාකමකින් යුත් රුපියල් ලබාගත යුතු ය.

භාණ්ඩ හා සේවා අපනයනය කළ විට ඒ සඳහා ආදායම් ලැබෙන්නේ විදේශ මුදල්වලිනි. එය විදේශ විනිමය සැපයෙන ප්‍රධාන මාර්ගයක් වේ. විදේශ රටවලින් ගලා එන කළඹ ආයෝජනත් විදේශ සෘජු ආයෝජනත් ලැබෙන්නේ විදේශ මුදල්වලිනි. ඒවා දේශීය මුදලට පරිවර්තනය කිරීම හේතුවෙන් විදේශ විනිමය සැපයුමක් ඇති වේ. විදේශ සංචාරකයන් පැමිණෙන විට වැය කිරීම සඳහා මුදල් රැගෙන එන්නේත් විදේශ මුදල්වලිනි. ඒවා දේශීය මුදලට පරිවර්තනය කිරීම හේතුවෙන් ද විදේශ විනිමය සැපයුමක් ඇති වේ.


විදේශ විනිමය සැපයුම් ප්‍රමාණය තීරණය වනුයේ විදේශ විනිමය ඒකකයක මිල මත ය. එ නම් විදේශ මුදල් ඒකකයක් සඳහා ගෙවිය යුතු දේශීය මුදල් ප්‍රමාණය මත ය. උදාහරණයක් වශයෙන් ශ්‍රී ලංකා විදේශ විනිමය වෙළෙඳපොළෙහි එක්සත් ජනපද ඩොලර් සැපයුම සළකා බැලිය හැකි ය. එය රඳා පවතින්නේ එක්සත් ජනපද ඩොලර් එකක් සඳහා ගෙවිය යුතු ශ්‍රී ලංකා රුපියල් ප්‍රමාණය මත ය. විදේශ විනිමය ඒකයක මිල වැඩිවීමත් සමග විදේශ විනිමය සැපයුම් ප්‍රමාණය වැඩි වන අතර විදේශ විනිමය ඒකකයක මිල අඩුවීමත් සමග විදේශ විනිමය සැපයුම් ප්‍රමාණය අඩු වේ. උදාහරණයක් ලෙස ඩොලර් එකක් සඳහා සපයන රුපියල් ප්‍රමාණය වැඩිවන විට ඩොලර් සපයන ප්‍රමාණය වැඩිවන අතර ඩොලර් එකක් සඳහා ගෙවන රුපියල් ප්‍රමාණය අඩුවන විට සපයන ඩොලර් ප්‍රමාණය අඩු වේ. විදේශ විනිමය වෙළෙඳපොළේ විදේශ විනිමය සැපයුම සාමාන්‍යය භාණ්ඩයක සැපයුම් වක්‍රයක ආකාරයට ම වමේ සිට දකුණට ඉහළට නගින වක්‍රයකින් දැක්විය හැකි ය. 2 වන රූප සටහනෙහි SS මඟින් විදේශ විනිමය සැපයුම් වක්‍ර ය පෙන්නුම් කෙරේ.

රූප සටහන 2
විදේශ විනිමය වෙළෙඳපොළේ විදේශ විනිමය සැපයුම් වක්‍රය




ඉහත ආකාරයට විදේශ විනිමය ඉල්ලුම හා සැපයුම තීරණය වන අතර එම බලවේග නිදහසේ ක්‍රියාත්මක වීමට ඉඩ හැරීම තුළින් සාමාන්‍ය භාණ්ඩයක මිල තීරණය වන ආකාරයට පාවෙන (උච්චාවචනය වන) විනිමය අනුපාතිකය තීරණය වේ.

රූප සටහන 3
පාවෙන විනිමය අනුපාතය තීරණය වීම





විදේශ විනිමය ඉල්ලුමත් විදේශ විනිමය සැපයුමත් පිළිවෙලින් ඉහත රූප සටහනෙහි DD සහ SS වක්‍රවලින් දැක් වේ. E වලින් දැක්වෙන්නේ විනිමය අනුපාතිකය ය. විදේශ විනිමය ඉල්ලුම විදේශ විනිමය සැපයුමට සමාන කෙරෙන සමතුලිත විනිමය අනුපාතිකය $E_0$ වලින් දැක්වේ.

## ඉල්ලුම් සැපයුම් බලවේග වෙනස් වීම තුළින් විනිමය අනුපාතය වෙනස්වන ආකාරය

### විදේශ විනිමය සැපයුම වැඩිවන විට විනිමය අනුපාතය වෙනස්වීම

කිසියම් රටක විදේශ විනිමය ඉල්ලුම සඳහා බලපාන සාධක ස්ථාවර ව පවතී යයි උපකල්පනය කළ විට විදේශ විනිමය සැපයුම පමණක් වැඩිවන්නේ නම් විදේශ විනිමය සැපයුම් වක්‍රය දකුණට විතැන් වේ. උදාහරණයක් වශයෙන් රටක භාණ්ඩ හා සේවා අපනයන ප්‍රමාණය වැඩිවුවහොත් විදේශ විනිමය වෙළෙඳපොළේ විදේශ විනිමය සැපයුම වැඩි වේ. එවිට විදේශ විනිමය සැපයුම් වක්‍රය SS සිට $S_1 S_1$ දක්වා දකුණට විතැන් වේ. (4 වන රූප සටහන බලන්න).

රූප සටහන 4
විදේශ විනිමය සැපයුම වැඩිවීම




විදේශ විනිමය සැපයුම වැඩිවන විට විනිමය අනුපාතය අඩු වේ. ඒ නම් දේශීය මුදලේ විදේශීය අගය වැඩි වේ. (විනිමය අනුපාතිකය අතිප්‍රමාණය වේ). දේශීය මුදලේ විදේශ අගය වැඩිවන විට රටක් ආනයනය කරන භාණ්ඩවල මිල අඩු වී අපනයනය කරනු ලබන භාණ්ඩ වල මිල වැඩි වේ. ඒ නම් මෙවන් අවස්ථාවක දී ආනයනය රටකට වාසිදායක වන අතර අපනයනය සඳහා එය අවාසිදායක වේ. ඉහත පරිදි ආනයන හා අපනයනවල සාපේක්ෂය මිල ගණන් වෙනස්වීම අනුව ආනයන අපනයන ප්‍රමාණයන් වෙනස්වීමක් සිදු වේ.

**විදේශ විනිමය සැපයුම අඩුවන විට විනිමය අනුපාතය වෙනස්වීම**

විදේශ විනිමය ඉල්ලුම ස්ථාවර ව පවතින අවස්ථාවක දී විදේශ විනිමය සැපයුම අඩු වන විට විදේශ විනිමය සැපයුම් වක්‍රය SS සිට $S_1S_1$ දක්වා වමට විතැන් වේ. (5 වන රූප සටහන බලන්න). උදාහරණයක් ලෙස කිසියම් රටක භාණ්ඩ හා සේවා අනයනය ස්ථාවර ව තිබිය දී අපනයන අඩු වුවහොත් විදේශ විනිමය වෙළෙඳපොළේ විදේශ විනිමය සැපයුම අඩු වේ. මෙහි දී විදේශ විනිමය සැපයුම් වක්‍රය වමට විතැන් වේ.

රූප සටහන 5
විදේශ විනිමය සැපයුම අඩුවීම





විදේශ විනිමය වෙළෙඳපොළේ විදේශ විනිමය සැපයුම අඩුවන විට විදේශ විනිමය අනුපාතිකය වැඩි වේ. (5 වන රූප සටහනෙහි සමතුලිත මිල $E_0$ සිට $E_1$ දක්වා වෙනස් වීමෙන් එය පැහැදිළි කෙරේ). විනිමය අනුපාතය වැඩි වූ විට දේශීය මුදලේ විදේශීය අගය අඩු වේ. (විනිමය අනුපාතිකය අවප්‍රමාණය වේ). දේශීය මුදලේ විදේශීය අගය අඩුවන විට රටක් ආනයනය කරන භාණ්ඩවල දේශීය මිල වැඩිවන අතර අපනයන භාණ්ඩවල විදේශීය මිල අඩු වේ.

**විදේශ විනිමය ඉල්ලුම අඩුවන විට විනිමය අනුපාතය වෙනස්වීම**

කිසියම් රටක භාණ්ඩ හා සේවා අපනයන ස්ථාවර ව තිබිය දී ආනයන අඩු වුවහොත් විදේශ විනිමය ඉල්ලුම අඩු වේ. ඒ අනුව කිසියම් රටක විදේශ විනිමය ගෙවීම් අඩුවන විට විදේශ විනිමය ඉල්ලුම අඩු වේ. මෙම තත්ත්වය විදේශ විනිමය සඳහා වන ඉල්ලුම් වක්‍රය වමට විතැන්වීමෙන් පෙන්විය හැකි ය. (6 වන රූප සටහන බලන්න).

රූප සටහන 6
විදේශ විනිමය ඉල්ලුම අඩුවීම





විදේශ විනිමය ඉල්ලුම අඩුවන විට විදේශ විනිමය අනුපාතිකය අඩු වේ. එවිට දේශීය මුදලේ විදේශීය අගය වැඩි වේ.

**විදේශ විනිමය ඉල්ලුම වැඩිවන විට විනිමය අනුපාතය වෙනස්වීම**

රටක භාණ්ඩ හා සේවා අපනයන ස්ථාවර ව තිබිය දී ආනයන වැඩි වුව හොත් විදේශ විනිමය ඉල්ලුම වැඩි වේ. ඒ නම් රටක විදේශ විනිමය ගෙවීම් වැඩිවන විට විදේශ විනිමය වෙළෙඳපොළේ විදේශ විනිමය ඉල්ලුම වැඩි වේ. විදේශ විනිමය ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වීමෙන් මෙම තත්ත්වය නිරූපනය කළ හැකි ය. (7 වන රූප සටහන බලන්න).

රූප සටහන 7
විදේශ විනිමය ඉල්ලුම වැඩිවීම





ඉහත රූප සටහනින් පෙන්නුම් කරන පරිදි ආනයන වැඩි වී විදේශ විනිමය ඉල්ලුම වැඩි වූ විට විනිමය අනුපාතය ඉහළ යයි. එ විට දේශීය මුදලේ විදේශීය අගය අඩු වේ.

### එකවර ආනයන වැඩිවීම හා අපනයන අඩුවන තත්ත්වයක් යටතේ විනිමය අනුපාතය තීරණය වීම

භාණ්ඩ හා සේවා ආනයන හා අපනයන එකවර වෙනස්වන තත්ත්වයක් සළකා බලන විට විදේශ විනිමය ඉල්ලුම හා සැපයුම එකවර වෙනස් වේ. උදාහරණයක් ලෙස ආනයන වැඩිවීමක් සහ අපනයන අඩුවීමක් එකවර සිදුවන අවස්ථාවක දී විදේශ විනිමය ඉල්ලුම වැඩිවන අතර අපනයන අඩුවන විට විදේශ විනිමය සැපයුම අඩු වේ. එ නම් විදේශ විනිමය අනුපාතය නියත වශයෙන්ම ඉහළ යෑමක් සිදු වේ.


රූප සටහන 8
ආනයන වැඩිවීම හා අපනයන අඩුවීම එකවර සිදුවීම




### ආනයන හා අපනයන එකවර අඩුවන තත්ත්වයක් යටතේ විනිමය අනුපාතිකය තීරණය වීම

භාණ්ඩ හා සේවා ආනයන හා අපනයන එකවර සමාන අනුපාතයකින් අඩුවන අවස්ථාවක දී විදේශ විනිමය ඉල්ලුම හා විදේශ විනිමය සැපයුම සමාන අනුපාතයකින් අඩු වේ. එ

රූප සටහන 9
ආනයන හා අපනයන එකවර අඩුවීම





විට විදේශ විනිමය ඉල්ලුම් වක්‍රය හා විදේශ විනිමය සැපයුම් වක්‍රය යන දෙක ම සමාන ප්‍රමාණයකින් වමට විතැන් වන අතර විනිමය අනුපාතිකයේ වෙනස් වීමක් සිදු නො වේ. (9 වන රූප සටහන බලන්න).

විදේශ විනිමය වෙළෙඳපොළක විදේශ විනිමය ඉල්ලුම හා සැපයුම එකවර වෙනස්වන විට විනිමය අනුපාතය වෙනස්වීම තීරණය වනුයේ විදේශ විනිමය ඉල්ලුම හා සැපයුම වෙනස් වන ප්‍රමාණය මත ය. එ නම් විදේශ විනිමය ඉල්ලුම් හා සැප-යුම් වක්‍රය විතැන්වන ප්‍රමාණය මත ය.

### අපනයනවලට වඩා ආනයන වැඩිවන තත්ත්වයක් යටතේ විනිමය අනුපාතය තීරණය වීම

විශේෂයෙන් ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවත්නා රටවල අපනයන වැඩිවනවාට වැඩියෙන් ආනයන වැඩිවන තත්ත්වයක් දැකිය හැකි ය. එ නම් මෙ වැනි අවස්ථාවක දී විදේශ විනිමය ලැබීම්වලට වඩා වැඩියෙන් විදේශ විනිමය ගෙවීම් වැඩි වේ. එ නම් විදේශ විනිමය සැපයුම වැඩිවනවාට වඩා වැඩියෙන් විදේශ විනිමය ඉල්ලුම වැඩි වේ. මෙ වැනි විටෙක දී විදේශ විනිමය සැපයුම් වක්‍රය දකුණට විතැන් වනවාට වඩා වැඩි ප්‍රමාණයකින් විදේශ විනිමය ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වේ. (10 වන රූපය බලන්න).

රූප සටහන 10
විදේශ විනිමය සැපයුමට වඩා විදේශ විනිමය ඉල්ලුම ඉහළ යාම





මෙ වැනි තත්ත්වයක් පවතින රටක විනිමය අනුපාතය ඉහළ යෑමට විශාල ඉඩක් පවතී. විදේශ ආයෝජන ගලා ඒම, සංචාරක ඉපැයීම්, විදේශවලින් ලැබෙන සංක්‍රාම වැනි විදේශ වෙළෙඳාමට පරිබාහිර වූ විදේශ විනිමය සැපයුමක් ද පවතින නිසා එ ලෙසින් විනිමය අනුපාතිකය ඉහළ යෑම අනිවාර්යය සංසිද්ධියක් නො වේ. (ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳ හිඟය දිගින් දිගට ම පුළුල් වන තත්ත්වයක් පැවතුන ද විනිමය අනුපාතිකය එයට සමානුපාතික ව ඉහළ යෑමක් දැක ගත නො හැක්කේ එම කරුණු හේතුවෙනි).

### ආනයනවලට වඩා අපනයන වැඩිවන තත්ත්වයක් යටතේ විනිමය අනුපාතය තීරණය වීම

ආනයනවලට වඩා අපනයන වැඩි තත්ත්වයක් යටතේ ආනයන ගෙවීම්වලට වඩා අපනයන ඉපයුම් වැඩි වේ. එ නම් විදේශ විනිමය ඉල්ලුමට වඩා විදේශ විනිමය සැපයුම වැඩි වේ. එ විට විදේශ විනිමය ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වන ප්‍රමාණයට වඩා විදේශ විනිමය සැපයුම් වක්‍රය දකුණට විතැන් වේ. 11 වන රූප සටහනින් එය පෙන්වා දී ඇත. විදේශ විනිමය ඉල්ලුම් වක්‍රය DD සිට $D_1D_1$ දක්වා සුළු ප්‍රළමාණයකින් දකුණට විතැන් වී ඇත. නමුත් විදේශ විනිමය ඉල්ලුම් වක්‍රය SS සිට $S_1S_1$ දක්වා වැඩි ප්‍රමාණයකින් දකුණට විතැන් වී ඇත. ප්‍රතිඵලයක් වශයෙන් සිදුවන විනිමය අනුපාතිකයේ පහළ යෑම ද එ මඟින් නිරූපණය වෙයි. ඒ, එය $E_1$ සිට $E_0$ දක්වා පහළ යන බව දැක්වීමෙනි.

රූප සටහන 11
විදේශ විනිමය ඉල්ලුමට වඩා විදේශ විනිමය සැපයුම වැඩිවීම




ඉහත සටහනින් පෙන්නුම් කරන ලෙසට මෙවන් තත්ත්වයක් පවතින රටවල විනිමය වෙළෙඳපොළේ විදේශ විනිමය ඉල්ලුමට වඩා විදේශ විනිමය සැපයුම වැඩි බැවින් විනිමය අනුපාතය අඩු වේ. එ නම් එවන් රටවල දේශීය මුදලේ විදේශීය අගය වැඩි වේ. චීනයේ රන්මින්බී (RMB) මුදලේ අගය වැඩිවීමට හේතු වී ඇත්තේ මෙම කාරණය යි. කෙ සේ වෙතත්, තමන් ගේ ව්‍යවහාර මුදල අඩු වටිනාකමක පවත්වා ගෙන යන බවට ඇමෙරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ බටහිර රටවල් චීනයට චෝදනා කරයි.

ඉහත ආකාරයට භාණ්ඩ හා සේවා ආනයන හා අපනයන වෙනස් වීමට අනුකූල ව විදේශ විනිමය ඉල්ලුම් හා සැපයුම් බලවේග ක්‍රියාත්මක වේ. ඊට අනුරූපව විදේශ විනිමය අනුපාතය වෙනස් වන අතර ඒ අනුව විදේශ විනිමය ඉල්ලුම හා සැපයුම වෙනස් වී අවසානයේ විදේශ විනිමය වෙළෙඳපොළ සමතුලිත වේ.

### පාවෙන විනිමය අනුපාතික ක්‍රමයක වාසි

- පාවෙන විනිමය අනුපාතික ක්‍රමයක් යටතේ විදේශ විනිමය අලෙවි කිරීමට හෝ විකිණීමට මහ බැංකුව බැඳී නොමැති නිසා ඒ යටතේ දේශීය මිල ස්ථායීතාව හා මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාව ඇතිකර ගැනීමට නිදහස් මූල්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට මහ බැංකුවට හැකියාව ඇත. ඒ නිසා අතිවිශාල විදේශීය සම්පත් ප්‍රමාණයක් පවත්වාගෙන යාම සීමා කළ හැකි ය.

- ස්ථාවර විනිමය අනුපාතිකයක් පවතින අවස්ථාවක දී ගෙවුම් ශේෂ හිඟයක් පියවා ගැනීම සඳහා දේශීය වශයෙන් නිමැවුම හා සේවා නියුක්තිය කැපකිරීමට සිදු වේ. නමුත් පාවෙන විනිමය අනුපාත ක්‍රමයක දී විදේශ විනිමය ඉල්ලුම හා සැපයුම සමතුලිත වන බැවින් ගෙවුම් ශේෂ හිඟයක් නොමැති අතර දේශීය වශයෙන් නිමැවුම් හා සේවා නියුක්තිය කැප නො කර ගෙවුම් ශේෂ හිඟය පියවා ගැනීමට හැකි ය. එ නම් ගෙවුම් ශේෂ හිඟය ඉබේ ම සමතුලිත වන යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වේ.

- ගෙවුම් ශේෂය ඉබේ ම සමතුලිතය වෙත ගෙන යන පාවෙන විනිමය අනුපාතික තත්වයක දී ප්‍රතිපත්ති සම්පාදකයින්ට විදේශ අසමතුලිතතා කෙරෙහි අවධානය යොමු කිරීමට අවශ්‍ය නොවන බැවින් ඔවුන්ගේ පූර්ණ අවධානය දේශීය ආර්ථික කටයුතුවලට යොමු කිරීමට හැකි ය.

- පාවෙන විනිමය අනුපාතික ක්‍රමයක තවත් වාසියක් වනුයේ මෙවන් තත්ත්වයක දී විදේශ විනිමය වෙළෙඳපොළේ ඉල්ලුමට සරිලන ආකාරයේ සැපයුමක් නිතර ම හැඩගැස්විය යුතු නිසා රටකට හිමි විදේශ විනිමය සංචිත සකසුරුවම් සහිත ව භාවිතා කළ හැකි වීම ය.

- පාවෙන විනිමය අනුපාතික ක්‍රමයක් සමපේක්ෂකයින්ට වාසිදායක තත්ත්වයක් උදාකරයි. සමපේක්ෂකයා වූ කලී වෙළෙඳපොළේ අපේක්ෂිත මිල වෙනසකින් වාසියක් අත්කර ගැනීමෙහි යෙදී සිටින්නෙකි. නුදුරු අනාගතයේ ශ්‍රී ලංකාවේ රුපියලේ විදේශීය අගය පහළ වැටේ යැයි අපේක්ෂා කරන අය හැකි තරම් භාණ්ඩ ආනයනය කර රැස්කර ගනී. එ මෙන් ම අනාගතයේ අපනයනය කළ හොත් වැඩි රුපියල් ප්‍රමාණයක් ලැබෙන හෙයින් අපයනකරුවෝ භාණ්ඩ රට යැවීම කල් දමති. මෙ වැනි සමපේක්ෂණ වාසි ලබා ගැනීම පාවෙන විනිමය අනුපාතික ක්‍රමයක ඉඩකඩ වැඩි ය.

- පාවෙන විනිමය අනුපාතික ක්‍රයමයක් තුළ සමපේක්ෂණය සඳහා පවත්නා ඉඩකඩ වැඩි බැවින් ව්‍යුත්පන්න උපකරණ භාවිතය සඳහා අවකාශය ලැබේ. එ නම් පාවෙන විනිමය අනුපාතික ක්‍රමයක දී විනිමය අනුපාතය උච්චාවචනය ඉහළ බැවින් එම අවදානම කළමනාකරණය සඳහා විශේෂිත ව්‍යුත්පන්න උපකරණ යොදා ගැනෙයි. ඉදිරි විදේශ

විනිමය රැකුම් තුළින් ඵ වැනි උච්චාවචන අවම කරගත හැකි ය. ඉදිරි විදේශ විනිමය රැකුමක් යනු වෙළෙඳාමට සම්බන්ධ වන පුද්ගලයන් දෙදෙනා විසින් වෙළෙඳාම ගිවිසගත් දිනයේ සිට වෙළෙඳාම අවසාන වන දිනය අතර කාලය තුළ දී විනිමය අනුපාතිකයන් ගේ වෙනස්කම් තුළින් භාණ්ඩ මිල කෙරෙහි ඇතිවන බලපෑම නො සළකා හරින බවට ගිවිසුමකට එළැඹීම ය. එම ගිවිසුම අනුව භාණ්ඩ හුවමාරුව සිදුවනුයේ වෙළෙඳාම ගිවිසගත් දිනයේ පැවැති විනිමය අනුපාතය යටතේ ය. එම නිසා ව්‍යාපාරික අස්ථාවරතාවක් ඇති නො වේ.

**පාවෙන විනිමය අනුපාතික ක්‍රමයක අවාසි**

- පාවෙන විනිමය අනුපාතික ක්‍රමයක් යටතේ විනිමය අනුපාත අතර නිතර නිතර වෙනස්වීම් සිදුවීම තුළින් ආනයන හා අපනයන භාණ්ඩවල මිල ගණන් නිරතරු ව වෙනස් වීමට ලක් වේ. ඵ වැනි මිල වෙනස්වීම්වලට ක්ෂණික ව ප්‍රතිචාර දැක්විය හැකි වනුයේ ඉල්ලුම හා සැපයුම නම්‍ය අර්ථ ක්‍රමයන්ට පමණි. ඵ වැනි තත්ත්වයක් පවතිනුයේ කාර්මික භාණ්ඩ නිපදවන අර්ථ ක්‍රමයන් තුළ පමණි. සාම්ප්‍රදායික භාණ්ඩ අපනයනය සහ කාර්මික හා අතරමැදි භාණ්ඩ ආනයනය මත පදනම් වූ බොහෝමයක් සංවර්ධනය වෙමින් පවතින රටවල පවතිනුයේ ඉල්ලුම හා සැපයුම යන දෙ අංශය ම අනම්‍ය වූ තත්ත්වයකි. බොහෝ විට මෙ වැනි රටවල වෙළෙඳ ශේෂයේ හිඟයක් දක්නට ලැබේ. එය විදේශ විනිමය සැපයුමට වඩා විදේශ විනිමය ඉල්ලුම වැඩිවීමට හේතු වේ. ඵ බැවින් විදේශ විනිමය ඉල්ලුම සහ සැපයුම අනම්‍ය ආර්ථිකයක පාවෙන ක්‍රමයක් ක්‍රියාත්මක කරන විට එය දේශීය මුදලේ විදේශීය අගය පහත දැමීමට (ඵ නම්, අවප්‍රමාණය කිරීමට) හේතු විය හැකි ය.

- තව ද ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමන් පවත්නා රටවල විදේශ විනිමය ඉල්ලුමට සරිලන විදේශ විනිමය සැපයුමක් නොමැත. නමුත් පාවෙන විනිමය අනුපාතික ක්‍රමයක් තුළ විදේශ විනිමය ගෙවීම්වලට සරිලන පරිදි විදේශ විනිමය ඉපයුම් වැඩිකළ යුතු ය. ඵ බැවින් පාවෙන විනිමය අනුපාතික ක්‍රමයක් මෙ වැනි රටක ක්‍රියාත්මක කිරීමෙන් විදේශ විනිමය වෙළෙඳපොළේ විදේශ විනිමය ඉල්ලුමට සරිලන ආකාරයේ සැපයුමක් කෘත්‍රිම ව හැඩගැස්විය යුතු ය. ඵ සේ හැඩගැස්වීම සඳහා ඵ වැනි රටකට ණය හා ආධාර මත යැපීමට සිදුවනු ඇත. ඵ බැවින් දිගින් දිගට ම ණය ලබා ගැනීම තුළින් මෙ වැනි රටවල ණයගැතිභාවය වැඩිවනු ඇත.

- විදේශ ණය හා පොළී ගෙවීම් වැඩිවීම තුළින් මෙම රටවල ගෙවුම් ශේෂයේ ප්‍රාග්ධන ගලායෑම් විශාල වීමට හේතුවන අතර එය එම රටවල ගෙවුම් ශේෂ ප්‍රශ්නය තව තවත් උග්‍රවීමට හේතු වේ.

- පාවෙන විනිමය අනුපාතික ක්‍රමයක් යටතේ විනිමය අනුපාතිකයන් නිතර නිතර වෙනස්වන විට ආනයන අපනයන මිල ගණන් නිතර නිතර වෙනස් වේ. ඵ සේ ආනයන අපනයන මිල ගණන් නිතර නිතර වෙනස් වන විට ජාත්‍යන්තර වෙළෙඳාමේ යෙදී සිටින ව්‍යාපාරිකයින්ට තම භාණ්ඩවල අවසාන මිල පිළිබඳ ස්ථිර නිගමනයකට එළඹීමට නො හැකි අතර ඵ මගින් ව්‍යාපාරික අස්ථාවරතා ඇතිවීමට මග පෑදෙයි.

- ඵ මෙන් ම නිදහස් චල විනිමය අනුපාතිකයේ ඇති තවත් අවාසි සහගත තත්ත්වයක් වන්නේ එය විශාල උච්චාවචනයන්ට භාජනය වීමත් බොහෝ විට විනිමය අනුපාතිකයේ සමබරතාවය නැතිවීමටත් හේතුවීම ය.

- පාවෙන විනිමය අනුපාතිකයක් මෘදු ලෙස ක්‍රිකයාත්මක වීම සඳහා කාර්යක්ෂම විදේශ විනිමය වෙළෙඳපොළක් පැවතිය යුතු ය. එහෙත් සංවර්ධනය වෙමින් පවත්නා රටවල ඵ වැනි වෙළෙඳපොළක් නොමැත. ✪

# බ්‍රෙට්න් වුඩ්ස් කතාව


**වරුණ චන්ද්‍රකීර්ති**

සන්නිවේදන දෙපාර්තමේන්තුව

1944 වසරේ ජූලි මාසය උදාවුනේ දෙවැනි ලෝක යුද්ධයේ ගිනි දැල් බුර බුරා නගිමින් තිබිය දී ය. ජුනි 6 වැනි දා දියත් කෙරුණු නෝමැන්ඩි ආක්‍රමණය ජූලි මැද දක්වා ම ඇදී ගියේ දෙපාර්ශ්වයේ ජීවිත දෙ ලක්‍ෂ තිස්දහසකට අධික ගණනක් බිල්ලට ගනිමිනි. නැගෙනහිර පෙරමුණින් ඉදිරියට ඇදුණු සෝවියට් රතු හමුදාව ජුනි 29 දා මින්ස්ක් ආක්‍රමණය දියත් කළේ ය. එයින් රතු හමුදාවේ ලක්‍ෂ හතරක් මිය ගියේ ය. එයට අමතර ව, ජපන් හමුදා සමඟ එක් වූ සුභාෂ් චන්ද්‍රබෝස් ගේ නායකත්වයෙන් යුතු "නිදහස් ඉන්දියා පිටුවහල් රජයේ හමුදාව" ඉන්දියාවේ බ්‍රිතාන්‍ය ආධිපත්‍යයට එරෙහි ව ඉම්පාල් යුද්ධය මෙහෙයවමින් සිටියේ ය. ජූලි 3 වැනි දා අවසන් වූ එම යුද්ධයට දෙපාර්ශ්වයේ හැත්තෑ දහසකට වැඩි පිරිසක් බිලි වූයේ ය. මේ සියල්ලට අමතර ව, ඇමෙරිකා එක්සත් ජනපදයේ සුප්‍රසිද්ධ කළු ජාතික මලල ක්‍රීඩකයකු වූ ජැකී රොබින්සන් ව යුද්ධාධිකරණයට පැමිණවීම නිසා ජනතාවට කතා කරන්නට තවත් මාතෘකාවක් ද ලැබී තිබිණි.

මෙ ලෙසින් මුළු ලෝකය ම ප්‍රවෘත්තිවලින් වැසී ඇති අවස්ථාවක, සැමකකු ගේ ම ඇස් කණ් පිරී තිබුණු අවස්ථාවක 1944 ජූලි 1 දා බ්‍රෙට්න් වුඩ්ස් සමුළුව ඇරඹිණි. මේ නමින් ප්‍රචලිත වී තිබුණත් මෙය විධිමත් ලෙසින් හැඳින්වෙන්නේ එක්සත් ජාතීන් ගේ මුදල් හා මූල්‍ය සමුළුව (United Nations Monetary and Financial Conference) යනුවෙනි. මෙම සමුළුව මුළු දුන්නේ ඇමෙරිකා එක්සත් ජනපදයේ නිව් හැම්ප්සයර් ප්‍රාන්තයේ කැරොල් නගරයට අයත් ප්‍රදේශයක් වන බ්‍රෙට්න් වුඩ්ස් ආසන්නයේ පිහිටි මවුන්ට් වොෂින්ටන් හෝටලයේ දී ය. මෙම සමුළුවේ කතාව මෙන් ම මවුන්ට් වොෂින්ටන් හෝටලයේ කතාව ද ඉතා රසවත් එකකි. ඒ තුළින් කියැවෙන ආර්ථික ඉතිහාසයක් ද වෙයි. එ බැවින්, මෙම ලිපියේ දී මුලින් ම කෙරෙන්නේ ඒ පිළිබඳ ව ඉතා සැකෙවින් විමසා බැලීම යි.

කිනම් ආර්ථික මිනුම් අනුව ගත්ත ද, මවුන්ට් වොෂින්ටන් හෝටලය යනු ඉතාමත් සුඛෝපභොගී නිවාඩු නිකේතනයකි. මෙම හෝටලය ඉදි කරනු ලැබුවේ ගල් අඟුරු වෙළෙඳාමෙන් ධනවත් වූ ජෝෂප් ස්ටික්නි නමැත්තකු විසිනි. වයස අවුරුදු 30 වීමටත් මත්තෙන් විශාල ධනයක් උපයාගත් ස්ටික්නි පසු කාලයක දී දේපල වෙළෙඳාම් කටයුතුවලට අත ගැසී ය. වොෂින්ටන් කන්ද පාමුල පිහිටි මවුන්ට් ප්ලසන්ට් හෝටලය මිල දී ගැනීමට 1881 දී ඔහු යොමු වුයේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. එයින් අවුරුදු 19 ක් ගිය තැන ඒ හෝටලය බිමට සමතලා කර දැමීමට තීරණය කළ ස්ටික්නි නව ඉදි කිරීමකට මුල පිරුවේ ය. ඒ සඳහා සුප්‍රසිද්ධ සැලසුම් ශිල්පියකු ගේ උපකාරය ලබාගත් ඔහු හෝටලයේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් ම ඒ කාර්යයේ නිපුණ ඉතාලි සිප්කරුවන් 250 ක ගේ සේවය ලබාගත්තේ ය.




බ්‍රෙට්න් වුඩ්ස් සමුළුව මුළු දුන් මවුන්ට් වොෂින්ටන් හෝටලය

ඉංග්‍රීසි හෝඩියේ "වයි" අකුරේ හැඩයට ඉදි කෙරුණු හෝටලය සඳහා එක්සත් ජනපද ඩොලර් ලක්ෂ 17 ක් වැයවිණි. මෙය 2010 වසරේ වටිනාකම් අනුව සැළකූ විට කෙතරම් විශාල මුදලක් දැ යි වටහා ගත හැකි ය. පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වී ගණනය කළ විට මෙය 2010 වසර වන විට එක්සත් ජනපද ඩොලර් ලක්ෂ 440 ඉක්මවා තිබිණි. දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය මත පදනම් වී ගණනය කළ විට එහි අගය එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 366 ඉක්මවයි. නාමික ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතයට අනුව ගණනය කළ විට එය එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 264 ක් ඉක්මවයි. දළ ජාතික නිෂ්පාදිතයට සාපේක්ෂ භාගයක් ලෙසින් ගත් කල එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 1040 ඉක්මවයි!

(Presidential Range) අයත් උස ම කන්ද යි. එම කාරණය විසින් ද මෙම හෝටලයට තිබූ ආකර්ෂණය ඉහළ නංවනු ලැබී ය. කෙ සේ වුව ද, මහා ආර්ථික අවපාතය විසින් ඇති කළ අඳුරට මේ සියලු ආනුභාවයන් යටපත් ව ගියේ ය. ස්ටික්නි මහත්මිය මියගිය විට 1936 දී, හෝටලයේ උරුමය ඇය ගේ බෑණාට පැවරිනි. එහෙත් අවපාතයෙන් උදා වූ දුර්භාග්‍යය දෙවන ලෝක යුද්ධය නිසා දෙගුණ තෙගුණ වී ගියේ ය. 1942 වසරේ දී, ඒ මහානුභාවසම්පන්න හෝටලය වසා දමනු ලැබීය. හෝටලය වසා තිබූ කාලයේ දී විටින් විට එහි ඉහළ මාලයේ සිට තරප්පුව දිගේ පහළට බැස එන ස්ටික්නි මහත්මිය ගේ රූපය සේවකයන් හට දර්ශනය වූ බවක් ද එහි වාර්තාවල සටහන් ව තිබේ!

මේ සියල්ලෙන් කියැවෙන්නේ පසු ගිය ශත වර්ෂය ආරම්භයේ දී ඉදි කළ මෙම ගොඩනැගිල්ල සඳහා කෙ තරම් විශාල මුදලක් වැය කළේ ද යන්න ය. වර්ග අඩි ලක්ෂ දෙකක් ඉක්ම වූ දැව ඇතිරූ බිම, සැතපුම් 11 කට වඩා දිගින් යුතු ජල නල, වර්ග අඩි 52,000 ක් ඉක්ම වූ වහල, ඝන අඩි මිලියන දෙකකටත් වඩා වැඩි දැව දඬු සහ වර්ග අඩි ලක්ෂ 9 කට වැඩි කපරාරුවලින් හෙබි මෙම ගොඩනැගිල්ලේ තරම "ද බියුගල් ඔෆ් බ්‍රෙටින් වුඩ්ස්" (The Bugle of Bretton Woods) පුවත්පතෙහි 1902 ඔක්තෝබර් 1 දා කලාපයෙන් වර්ණනා කොට ඇත. එම වසරේ ජූලි 28 වන දා මෙම හෝටලය විවෘත කරන අවස්ථාවේ දී පවත්වනු ලැබූ භෝජන සංග්‍රහයේ දී පැමිණ සිටියෝ නො නවත්වා ම ස්ටික්නි ව වර්ණනා කරන්නට වූහ. ඒ අවස්ථාවේ දී මධු බඳුනක් අතට ගත් ස්ටික්නි "මහත්වරුනි, බලන්න මා දෙස. මම තමයි මේ සියල්ල ගොඩ නැගූ දුප්පත් මෝඩයා" කියා සව්දිය පිරුවේ ය. ලෝක දේශපාලනික හා ආර්ථික රටාව වෙනස් කිරීමට මුල් වූ සමුළුවක් මේ හෝටලයේ පවත්වනු ඇති බවක් සිහියෙන් හෝ සිතීමේ ඉඩ කඩක් ස්ටික්නි හට නො වී ය. හෝටලය විවෘත කර වසරක් ගිය තැන ඔහු මිය ගියේ ය.



බ්‍රෙටින් වුඩ්ස් පිහිටා ඇති ස්ථානය. (විශාල කොට දක්වා ඇත්තේ නිව් හැම්ප්ෂයර් ප්‍රාන්තය යි.

දෙවන ලෝක යුද්ධය තවදුරටත් ඇවිලෙමින් තිබුණ ද ව්‍යාපාරිකයන් ගේ අවධානයෙන් නො ගිලිහී සිටීමේ වාසනාව මවුන්ට් වොෂින්ටන් හෝටලය වෙත ශේෂ ව තිබිණි. අවසානයේ දී, එය බොස්ටන් නුවර ව්‍යාපාරික සමායතනයක අයිතියට පත්විය. ඔවුන් විසින් එය මිල දී ගනු ලැබුවේ එක්සත් ජනපද ඩොලර් හාර ලක්ෂ පනස් දහසක මුදලකට ය. වසර 40 කට පෙර ඩොලර් ලක්ෂ 17 ක් වියදම් කර තැනූ හෝටලයේ වටිනාකම මුල් වටිනාකමින් හතරෙන් පංගුවකට ආසන්න නාමික අගයක් දක්වා පහත වැටී තිබීම මෙහි දී සළකා බැලිය යුතු වැදගත් කාරණයකි. පාරිභෝගික මිල දර්ශකයේ විචලනය අනුව ගණනය කළ විට 1902 දී ඩොලර් ලක්ෂ 17 ක වටිනාකමක් 1944 වන විට ඩොලර් ලක්ෂ 36 කට ආසන්න වී තිබිය යුතු ය. කෙ සේ වුව ද, මවුන්ට් වොෂින්ටන් හෝටලය අලෙවි වී තිබුණේ එම අගයෙන් අටෙන් පංගුවකට ආසන්න මුදලකට ය. (අදාළ කාලය තුළ එක්සත් ජනපදයේ පාරිභෝගික මිල දර්ශකය විචලනය වූ ආකාරය 1 වන රූප සටහනින් දැක්වෙයි. එය ඇඳ ඇත්තේ 1982 - 84 කාලය පදනම් වර්ෂය වශයෙන් ගැනීමෙනි. අදාළ ගණනය කිරීම් www.measuringworth.com වෙබ් අඩවියේ උපකාරයෙන් සිදු කර ඇත).

ස්ටික්නිගෙන් අනතුරු ව හෝටලයේ හිමිකාරීත්වය ඔහු ගේ බිරිඳට - කැරොලින් ස්ටික්නිට; පැවරිනි. තම පාලනය යටතේ හෝටලයට තවත් නවාංග එකතු කිරීමට ඇය සමත් වූවා ය. එතැන් සිට ගත වූ දශක තුනකට ආසන්න කාලය තුළ මවුන්ට් වොෂින්ටන් හෝටලයට උදා වූයේ ඉතා ඉහළ පිළිගැනීමකි. විවිධ මට්ටමේ ප්‍රභූහු විවේකය සඳහා මේ හෝටලයට ඇදී එන්නට වූහ. වොෂින්ටන් ජනාධිපතිවරයා ගේ නමින් නම් කරනු ලැබ ඇත්තේ ජනනායක කඳු වැටියට

මෙ ලෙසින් නව හිමිකාරීත්වයක් විසින් හෝටලයේ කටයුතු පවරාගත් වසරේ ම (එ නම්, 1944 වසරේ ම) ජූලි 1 දා බ්‍රෙටින් වුඩ්ස් සමුළුව ආරම්භ විය. මෙම සමුළුවට පහසුකම් සැලසීමෙන් මවුන්ට් වොෂින්ටන් හෝටලය උපයාගත් මුදල එක්සත් ජනපද ඩොලර් ලක්ෂ 3 කි. සමුළුව පැවැති දින 19 ක කාලය සඳහා එක් අයකුගෙන් ඩොලර් 18 ක කාමර ගාස්තුවක් අයකිරීමෙන් හෝටලය එම ආදායම උපයා ගත්තේ ය.

රූප සටහන 1

**ඇමෙරිකා එක්සත් ජනපදයේ වාර්ෂික උද්ධමනය**
**1902 සිට 1952 දක්වා**

(1982 - 84 = 100)



මූලාශය : www.measuringworth.com

මෙම සමුළුව සඳහා චීනය සහ රුසියාව ද ඇතුළත් ව රටවල් 44 කින් නියෝජිතයෝ 730 දෙනකු සහභාගී වූහ. පැවැති වාතාවරණය තුළ මෙම සහභාගීත්වය ඉතාමත් ඉහළ මට්ටමේ එකක් වශයෙන් සැළකිය යුතු වෙයි. කෙ සේ වෙතත්, මෙහි සාකච්ඡාවට පාත්‍ර වූයේ ජනතාවට තේරුම් ගැනීමට අපහසු, නීරස ආර්ථික සහ මූල්‍යමය කාරණා ගණනාවකි. ජනතාව ප්‍රිය නො කරන දේ වාර්තා කිරීමේ රුචියක් ජනමාධ්‍ය වෙත ද නො වී ය. එහෙත් මෙම සමුළුවේ අවස්ථා සහ ප්‍රතිඵල ලොවට කීම සඳහා ජනමාධ්‍ය ආයතන කිහිපයක් විසින් ම පිරිස් යොදවා තිබිණි. එම වාර්තාකරුවන්ට සටහන් කරගත හැකි වූයේ මවුන්ට් වොෂින්ටන් හෝටලයේ සමුළු ගැබ තුළින් එළියට දුන් තොරතුරක් දෙකක් පමණකි. කෙ සේ වෙතත්, මෙම සමුළුවට පැමිණ සිටියේ එවකට ලොව සිටි බලවත් ම පිරිසක් බව දන්නෝ දැන සිටියහ.

එක්සත් ජනපද කණ්ඩායමේ නායකත්වය භාණ්ඩාගාර ලේකම් හෙන්රි මෝගෙන්තෝ (Henry Morgenthau) ඉසුලුවේ ය. එහෙත් එම නායකත්වය හුදු නාමික එකක් බවට පත් කරමින් සැබෑ ලෙසට ම ඇමෙරිකානු කණ්ඩායමේ හඬ බවට පත් ව සිටියේ සහකාර භාණ්ඩාගාර ලේකම් හැරී ඩෙක්ස්ටර් වයිට් (Harry Dexter White) ය. විස්කොන්සින් ජනපදයේ ලෝරන්ස් විශ්වවිද්‍යාලයේ ඉගැන්වීමෙහි නියුතු ව සිටි වයිට් 1930 මැද භාගයේ දී වොෂින්ටන් නුවරට පැමිණියේ භාණ්ඩාගාරයේ ආර්ථික පර්යේෂණ අංශයේ කටයුතු භාර ගැනීම සඳහා ය. එහි දී, ඔහු අන්තර් ඇමෙරිකානු බැංකුවක් (Inter- American Bank) බිහිකිරීමට සැලසුම් කළේ ය. ලතින් ඇමෙරිකානු කලාපයේ රටවලට ණය දීමට ඒවායේ මුදලෙහි අගය ස්ථාවර ව පවත්වා ගත යුතු බවට අදහසක් විය. වයිට් විසින් අන්තර් ඇමෙරිකානු බැංකුව පිළිබඳ සැලසුම ඉදිරිපත් කළේ එම අදහස මුල් කරගෙන ය. එම සැලසුම ක්‍රියාත්මක කළ නො හැකි වුව ද මුදල්වල වටිනාකම් නියාමනය සඳහා සහ ඒ ඒ ව්‍යවහාර මුදල බිඳ වැටීමෙන් වළක්වා ගැනීම සඳහා ලෝක මට්ටමේ ආයතනයක් බිහි කළ යුතු බවට අදහසක් වර්ධනය කරගැනීමට වයිට් සමත් විය.

එක්සත් ජනපද කණ්ඩායමට සම්බන්ධ වී සිටි තවත් කැපී පෙනෙන පුද්ගලයකු වූයේ සහකාර රාජ්‍ය ලේකම් ඩීන් ඇචිසන් (Dean Acheson) ය. පසු කලෙක (එ නම් 1949 - 1953 කාලයේ දී) ඔහු ජනාධිපති හැරී ට්‍රෑමන් යටතේ රාජ්‍ය ලේකම් ධුරයට ද පත් විය. එක්සත් ජාතීන් ගේ සංවිධානය ගොඩනැගීමටත් මාෂල් සැලැස්ම පිළියෙල කිරීමටත් ඇචිසන් දායක විය. කොරියන් යුද්ධයට මැදිහත් වීම සඳහා ජනාධිපති ට්‍රෑමන් ව පෙළඹ වූ පුද්ගලයා වශයෙන් සැළකෙන්නේ ද මොහු ය. කෙ සේ වෙතත්, කොමියුනිස්ට් පාලන ක්‍රමය කෙරෙහි නැඹුරුවක් දැක්වූවකු බවට ද ඔහුට චෝදනා එල්ල වී තිබිණි. විශේෂයෙන් ම, චීනය මාවෝවාදීන් ගේ පාලනයට නතුවීමට ඇචිසන් ගේ දිරිගැන්වීම් හේතු වූ බව කියැවිණි.

මෙරනර් එක්ල්ස් (Mariner Eccles) ද එක්සත් ජනපද කණ්ඩායම නියෝජනය කළේ ය. 1934 සිට 1948 දක්වා කාලය තුළ ඇමෙරිකානු ෆෙඩරල් සංචිත බැංකුවේ අධිපති වශයෙන් කටයුතු කළේ එක්ල්ස් ය. ෆ්‍රැන්ක්ලින් ඩී. රූස්වෙල්ට් ජනාධිපතිවරයා යටතේ මෙන් ම හැරී ට්‍රෑමන් ජනාධිපතිවරයා යටතේ ද එම තනතුර ඉසිලීමෙන් ඔහුට තිබූ පිළිගැනීම පැහැදිළි වෙයි. අදාළ කාල පරිච්ඡේදය එක්සත් ජනපදයට ද මුළු මහත් ලෝකයට ද ඉතා තීරණාත්මක වූ එකකි. එයින් ද එක්ල්ස් ගේ වැදගත්කම තහවුරු වෙයි.

හෙන්රි මෝගෙන්තෝට අනතුරු ව භාණ්ඩාගාර ලේකම් ධුරයට සහ අනතුරු ව එක්සත් ජනපදයේ අග්‍ර විනිශ්චයකරු බවට පත් වූ ෆ්‍රෙඩ් වින්සන් (Fred Vinson) ද එක්සත් ජනපද නියෝජිත කණ්ඩායමට ඇතුළත් විය. බ්‍රෙටන් වුඩ්ස් සමුළුවට සහභාගී වන කාලයේ දී ඔහු එක්සත් ජනපද ආර්ථික ස්ථායිකරණ කාර්යාලයේ අධ්‍යක්ෂවරයා ය.

මේ සියලු දෙනා හා තනි ව ගනුදෙනු කළ හැකි පුද්ගලයෙක් බ්‍රිතාන්‍යය නියෝජිත කණ්ඩායමේ නායකත්වය දැරී ය. ඔහු අන් කිසිවකු නො ව, එම යුගයේ විසූ මහා ආර්ථික විද්‍යාඥයා වශයෙන් සැළකුණු ජෝන් මේනාඩ් කේන්ස් ය. මාක්ස් හැරුණු විට ප්‍රධාන පෙළේ ආර්ථික විද්‍යා ධාරාවකට ඇඳී ඇති එක ම පෙළපත් නම වනුයේ කේන්ස් යන්න ය. (මාක්ස්වාදී ආර්ථික න්‍යාය විධිමත් ආර්ථික විද්‍යා ධාරාවක් ලෙසින් පිළිගැනෙන්නේ නැත. එම පසුබිම තුළ කේන්ස්ට ලැබෙන වැදගත්කමෙහි තරම වටහා ගත හැකි ය. මාක්ස් මිය ගිය අවුරුද්දේ ම - එ නම්, 1883 වර්ෂයේ දී ම; කේන්ස් උපත ලබා තිබීම ද විශේෂ කාරණයකි). ජෝතිමත් වුවත් කේන්ස් කර්කෂ ගතිගුණවලින් හෙබි පුද්ගලයකු විය.



වයිට් සහ කේන්ස්

බ්‍රෙටින් වුඩ්ස් සමුළුව පැවැත්වීමට පෙර ගෙවුණු වසර කිහිපය මුළුල්ලේ ම කේන්ස් යොජනා කරමින් සිටියේ යම් ආකාරයක ආර්ථික හා මූල්‍යමය ක්‍රමවේදයක් අන්තර්ජාතික වශයෙන් ස්ථාපිත කළ යුතු බවට යි. ඒ වන විට රජයමින් පැවැතියේ එකිනෙකා ගේ බෙලි කපාගන්නා, වගකීම් විරහිත ආර්ථික හා මූල්‍යමය වාතාවරණයකි. ධනවාදයත් යටත්විජිතවාදයත් එක්තැන් වූ තැන එ බඳු පොර බැදීමක් රජකිරීම වටහා ගත හැකි ය. මෙම අවුල් සහගත තත්ත්වය අවසන් කරන, අන්තර්ජාතික වශයෙන් එකඟ විය හැකි ආර්ථික හා මූල්‍යමය ශික්ෂණයක් ඇති කළ හැකි ක්‍රමවේදයක් බිහිකිරීම කේන්ස් ගේ සිහිනය විය. එම සිහිනය යථාර්ථයක් බවට පත් කරගැනීමට සියලු රටවල මුදල් සඳහා පදනම් කරගත හැකි ආකාරයේ අන්තර්ජාතික ව්‍යාහාරික මුදල් ඒකකයක් නිකුත් කරන ගෝලීය මූල්‍යමය ආයතනයක් පිහිටුවිය යුතු බව ඔහු ගේ යෝජනාව විය. එම අන්තර්ජාතික මුදල් ඒකකය "බැන්කෝ (Bancor)" ලෙසින් නම් කළ හැකි බවක් ද ඔහු කියා සිටියේ ය. මෙම යෝජනාවට ඇමෙරිකානුවන් ද සහයෝගය පළ කළ අතර ඔවුන් ගේ මනාපය වූයේ අදාළ මුදල් ඒකකය "යුනිටාස් (Unitas)" යනුවෙන් හැඳින්වීමට ය.

බ්‍රෙටින් වුඩ්ස් සමුළුව මුළු දුන්නේ මෙ වැනි පසුබිමක් තුළ ය. කෙ සේ වෙතත්, සමුළුවට සහභාගී වූ අනෙකුත් රටවල නියෝජිතයන්ට ද පැවුරුණු රාජකාරි විය. නිදසුනක් ලෙස සෝවියට් සංගමයේ නියෝජිතයන් අපේක්ෂා කළ දේ ගෙන හැර දැක්විය හැකි ය. විප්ලවයෙන් අනතුරු ව නව රන් ආකර සොයා ගැනීමට සෝවියට් බලධාරීහු සමත් වූහ. දෙවන ලෝක යුද්ධය අවසන් වන කාලය එළැඹෙන විට ලොව දෙවන රන් නිෂ්පාදකයා බවට පත්වූයේ සෝවියට් දේශය යි. එයට ඉදිරියෙන් වූයේ දකුණු අප්‍රිකාව පමණකි. එම හැකියාව තුළ සෝවියට් දේශය බලාපොරොත්තු වූයේ ගොඩ නැගෙන නව ලෝකය මෙහෙයවන ආයතනවල වැදගත් තීරක බලයක් තමන් සතු කරගැනීමට ය.

කොපමණ වෙනස්කම් තිබුණත්, නියෝජිතයන් එකිනෙකා හා නිරන්තරයෙන් ගැටුනත් බ්‍රෙටින් වුඩ්ස්හි මවුන්ට් වොෂින්ටන් හෝටලයට රැස් වූ නියෝජිතයෝ ආරම්භයේ දී ම කරුණු තුනක් සම්බන්ධයෙන් එකඟතාවකට පැමිණියහ. පළමු එකඟතාව වූයේ අන්තර්ජාතික මූල්‍ය ස්ථාවරත්වය වෙනුවෙන් කිසියම් නිශ්චිත තීරණයකට එළැඹිය යුතු බව යි. ජාතීන් ගේ සංගමයට (League of Nations) සමාන්තර ව කටයුතු කෙරෙන මූල්‍යමය හා ආර්ථික සංවිධානයක් බිහි කරගැනීම දෙවන එකඟතාව යි. තුන්වන එකඟතාව සමුළුවේ කටයුතු සම්බන්ධයෙන් එළැඹුණු එකකි. එයින් කියැවුණේ සමුළුවේ කටයුතු වයිට් සහ කේන්ස් දෙදෙනා ගේ මෙහෙයවීම යටතේ සිදු විය යුතු බවයි.

මුල් දිනයේ පටන් ම සමුළුවේ කටයුතු පුද්ගලික හා දේශපාලනික කෝන්තරවලින් පිරුණු එකක් වීම අපේක්ෂා නො කළ එකක් නො වී ය. 1940 මැයි මාසයේ සිට 1944 දෙසැම්බර් මාසය දක්වා ප්‍රංශය පාලනය කෙරුණේ ජර්මානු යුද අධිකාරයක් යටතේ ය. බ්‍රෙටින් වුඩ්ස් සමුළුව ඇරඹෙන විට නෝමැන්ඩි යුද්ධය ඇරඹී තිබුණත් ප්‍රංශ රජය යනු ඇල්ජීරියාවේ සිට ක්‍රියාත්මක වූ පිටුවහල් ආයතනයක් පමණක් ම විය. බටහිර මිත්‍ර හමුදා විසින් පැරිස් නගරය මුදවා ගනු ලැබුවේ 1944 අගෝස්තු 25 වැනි දින ය. පැවැති වාතාවරණය තුළ පිටුවහල් ප්‍රංශ රජයට ශක්තිමත් අයුරින් සමුළුව නියෝජනය කිරීමට නො හැකි විය. එම නිසා, සමුළුව විසින් ගනු ලබන තීරණවල දී ප්‍රංශ අභිමතාර්ථ සාධනයට නිසි ඉඩක් නො සැළසෙනු ඇතැයි යන්න එහි නියෝජිතයන් ගේ මැසිවිල්ල විය. රුසියානුවන්ට වුවමනා වූයේ තමන් ගේ රන් බලය පෙන්වා පිහිටුවීමට අපේක්ෂා කළ අන්තර්ජාතික මූල්‍ය අරමුදලෙහි තීරක බලයක් ලබාගැනීම ය.

බ්‍රිතාන්‍යය හා එක්සත් ජනපද නියෝජිතයන් විසින් විසඳාගත යුතු ව තිබූ ගැටලු ප්‍රමාණය ද සුළුපටු නො වී ය. ඇමෙරිකානු ජාතිකවාදී අදහස් ගැනත් වරප්‍රසාදිත ආර්ථික හිමිකම් දිනා ගැනීමට ඇමෙරිකානුවන් පෙන් වූ ඇල්ම ගැනත් බ්‍රිතාන්‍යයෝ සැක කරන්නට වූහ. බ්‍රිතාන්‍ය භාණ්ඩාගාරයේ අධිපති ශ්‍රීමත් ජෝන් ඇන්ඩර්සන්ට ලිපියක් ලියමින් පසු ව කේන්ස් මේ ගැන හෙළිදරව් කර ඇත. "විස්තරාත්මක ව සැලසුම් පිළියෙල කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීමේ සැලසුම් හඳුන්වාදීම අතිශයින් ම වෙහෙසකර කටයුත්තක් විය. මේ කටයුතුවල දී ඔවුන් වෙතින් එල්ල වූ පීඩනය දරාගත නො හැකි තරම් විය. ... ඔවුහු ඔවුන්

ගේ ම මනෝ සංග්‍රාමයක් දියත් කළ අතර අනෙක් සියල්ලන් කෙරෙහි සැකයෙන් පසු වූහ".



කේන්ස් ආර්යාව - ලීඩියා ලොපොකෝවා

බ්‍රිතාන්‍යය - ඇමෙරිකානු එදිරිවාදිකම් ඉහළ දැමීමට පුද්ගලික කරුණු ද බලපෑවේ ය. එක්තරා තීරණාත්මක රාත්‍රියක දී එක්සත් ජනපද කණ්ඩායම් නායක හෙන්රි මෝගෙන්තෝ හට නිදාගත නො හැකි වූයේ කේන්ස් ආර්යාව ගේ හපන්කමකට පින්සිදුවන්නට ය. කේන්ස් විවාහ වී සිටියේ සුප්‍රසිද්ධ රුසියානු නලඟනක වූ ලීඩියා ලොපොකෝවා (Lydia Lopokova) සමඟ ය. ඒ තීරණාත්මක රාත්‍රියේ ඇය නැටුම් පුහුණු වෙමින් සිටියා ය. ඇය පුහුණුවීම් කටයුතුවල යෙදුණේ මෝගෙන්තෝ නැවතී සිටි කාමරයට එක එල්ලේ ම ඉහළින් වූ කාමරයක සිට ය!

මේ සියලු ආකාරයේ විභූෂණ සහ පුද්ගලික ගැටුම් මධ්‍යයේ බ්‍රෙටින් වුඩ්ස්හි දී සාකච්ඡාවට භාජනය කළ කරුණු අතිශයින් ම තීරණාත්මක ඒවා විය. ඒ ඒ පුද්ගලයන් වෙත වූ මතවාද කෙතරම් වෙනස් වුව ද විධිමත් ආකාරයෙන් සැකසුණු අන්තර්ජාතික මූල්‍ය හා ආර්ථික ක්‍රමවේදයක අවශ්‍යතාව සම්බන්ධයෙන් ද එවැනි ක්‍රමවේදයක් නියාමනය උදෙසා පිහිටුවන ආයතනික පද්ධතියක් රාජ්‍යයන් ගේ මැදිහත් වීමෙන් ගොඩනැගීම සම්බන්ධයෙන් ද සැවොම එක්වූහ. මෙ ලෙස එකඟ වූ පිරිස අතර නිදහස් වෙළෙඳපොළ ක්‍රමය මත පදනම් වූ ධනවාදී ක්‍රමය හදවතින් ගත්තෝ ද ආර්ථික ස්වයං නිර්ණය පිළිබඳ ව ලොල් වූවෝ ද වූහ. මෙ ලෙසින් ලෝක ව්‍යාප්ත මූල්‍ය හා ආර්ථික නියාමන ක්‍රමවේදයක් පිළිබඳ ව එකඟතාවක් ඇති කරගනු ලැබුවේ සියලු රාජ්‍යයෝ දේශපාලනික පෙරමුණෙහි විධිමත් ජාතීන් ගේ සංගමයක් (එ නම්, එක්සත් ජාතීන් ගේ සංවිධානය) බිහිකිරීමට යත්න දරමින් සිටිය දී ම ය.

අන්තර්ජාතික මූල්‍ය අරමුදලත් ලෝක බැංකුවත් බිහි විය.

නව ගෝලීය ව්‍යවහාර අරමුදලක් පිළිබඳ සිහිනය සැබෑ කරගත නො හැකි වුව ද අන්තර්ජාතික මූල්‍ය අරමුදල පිහිටුවීමෙන් තමන්ට වුවමනා වූ බොහෝ දේ සාක්ෂාත් කරගැනීමට කේන්ස් සහ වයිට් සමත් වූහ. නව අන්තර්ජාතික ව්‍යවහාර මුදලක් වෙනුවට තම ව්‍යවහාර මුදල් රන් හා ගැට ගැසීමට හෝ රන් හා ගැට ගැසූ එක්සත් ජනපද ඩොලරය සමඟ ගැට ගසා තැබීමට සියලු ජාතිහු එකඟ වූහ. "රන්වල ප්‍රජාපීඩක බව" මැඩ පැවැත්වීමට බ්‍රෙටින් වුඩ්ස් එකඟතා සමත් නො වුව ද එක්සත් ජනපද ඩොලරයට ජාතීන් අතර පිළිගැනීම පිරිනැමිනි. ලොව ඕනෑ ම තැනක දී රන් බවට පෙරළීමේ පිළිගැනුම එක්සත් ජනපද ඩොලරයට හිමි විය.

("The Tyranny of Gold" යන ප්‍රකාශය බෙන්ජමින් ඇන්ඩර්සන් ගේ Economics and the Public Welfare: A Financial and Economic History of the United States, 1914-1946 යන ග්‍රන්ථයෙන් හෙළි කළ එකකි. මුදලේ බලය පමණක් නො ව ඒ ඔස්සේ රාජ්‍ය බලය පවා දණගැස්වීමට රන්වලට තිබූ බලය එම ප්‍රකාශයෙන් කුළු ගැන්විණි. රන්වලට වූ ඒ බලය බිඳ දැමුණේ බ්‍රෙටින් වුඩ්ස් සමුළුව පවත්වා දශක තුනකට ආසන්න කාලයක් ගතවීමෙන් අනතුරු ව ය. ඇමෙරිකා එක්සත් ජනපද ජනාධිපති රිචඩ් නික්සන් විසින් 1971 අගෝස්තු 15 දා රන් මිනුම අත්හැර දැමීමෙන් එය සිදු විය. මේ "නික්සන් කම්පනය" වෙන ම ලිපියකින් කතා කළ යුත්තකි).

ලෝක බැංකුවට අයත් ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය පිළිබඳ අන්තර්ජාතික බැංකුව (International Bank for Reconstruction and Development) ද බ්‍රෙටින් වුඩ්ස් සමුළුවේ ප්‍රතිඵලයකි. සමුළුවට සහභාගී වූ සියල්ලන් ගේ මහත් වූ ප්‍රසාදයෙන් එම ආයතනය උපත ලැබී ය. කෙසේ වෙතත් අන්තර්ජාතික වෙළෙඳ සංවිධානය (ITO - International Trade Organization) පිළිබඳ යෝජනාවට යහපත් ප්‍රතිචාරයක් ලබාගැනීමට නො හැකි විය. වෙළෙඳාම හා තීරුබදු පිළිබඳ පොදු එකඟතාව (GATT - General Agreement on Tariffs and Trade) සඳහා පදනම් වූ මූලික

යෝජනාව කෙටුම්පත් කරගැනීමට පමණක් සමුළුවට සහභාගී වූවෝ සමත් වූහ. ලෝක වෙළෙඳ සංවිධානය (WTO - World Trade Organization) බිහි කරගත හැකි වූයේ 1995 වසරේ දී බව - එ නම්, බ්‍රෙට්න් වුඩ්ස් සමුළුවෙන් අඩසිය වසක කාලයක් ඉක්ම වූ පසු බව; අපි දනිමු. (මෙම සංවිධානයේ ඉදිරි ගමන තවමත් අවිනිශ්චිත ය).



බ්‍රෙට්න් වුඩ්ස් සමුළුව අමතන කේන්ස්

කේන්ස් ගේ සහ වයිට් ගේ ආර්ථික විශ්ලේෂණවල නිරවද්‍යතාව ගැන මිල්ටන් ෆ්‍රීඩ්මන් වැනි ආර්ථික විද්‍යාඥයෝ ප්‍රශ්න කළහ. එම විශ්ලේෂණ නිවැරැදි වුව ද බ්‍රෙට්න් වුඩ්ස් තීරණ ඒ සඳහා විසඳුමක් වන්නේ ද යන්නත් ඔවුහු ප්‍රශ්න කළහ. කෙ සේ වෙතත්, කේන්ස් ගේ සහ වයිට් ගේ තීරණ අගය කරන ආර්ථික විද්‍යාඥයෝ ද වෙති. එම තීරණ මත 1945 දී බ්‍රිතාන්‍යයට පිරිනැමුණු එක්සත් ජනපද ඩොලර් බිලියන 3.75 ක ඇමෙරිකානු ණය මුදලත් මාෂල්ස් සැලැස්ම යටතේ යුරෝපයට පිරිනැමුණු එක්සත් ජනපද ඩොලර් බිලියන 13 ත් 1949 දී ස්ටර්ලිං පවුම සියයට 30 කින් අවප්‍රමාණය කිරීමත් නිසා යුද්ධයෙන් වැනසුණු යුරෝපය පිබිදුණු බව එම විද්‍යාඥයන් ගේ අදහස යි.

කෙ සේ වෙතත්, මේ වන විට ප්‍රධානතම බ්‍රෙට්න් වුඩ්ස් තීරණයක් අතීතයට එක් කර අවසාන ය. එම සමුළුවෙන් තීරණය කෙරුණු අර්ධ-ස්ථාවර විනිමය අනුපාත ක්‍රමය 1971 දී අත්හැර දැමිණි. එයට අමතර ව, බ්‍රෙට්න් වුඩ්ස් ආයතන ලෙසින් හැඳින්වෙන ලෝක බැංකුව ගැනත් අන්තර්ජාතික මූල්‍ය අරමුදල ගැනත් දැන් පවතින්නේ සුභවාදී ඇගැයීමක් නො වේ. තුන්වන ලෝකයේ රටවල් විඳින බොහෝ ආර්ථික පීඩා සම්බන්ධයෙන් එම ආයතන දෙක දෝෂ දර්ශනයට ලක් වී තිබේ.

බ්‍රෙට්න් වුඩ්ස් තීරණ මෙම ඉරණමට පත්වූයේ ඒවායේ දෝෂ නිසා විය හැකි ය. මෙ ලෙසින් අවසනාවන්ත අවසානයක් අත් කරගත්තේ එම තීරණ පමණක් නො වේ. එම සමුළුවට සහභාගී වූවෝ ද එ ලෙසින් ම මෙ ලොව හැර ගියහ. සමුළුව අවසන් වීමට දින 3 ක් ඉතිරි ව තිබිය දී (එ නම්, 1944 ජූලි 19 වැනි දා), හෘදයාබාධයක් වැළඳී මවුන්ට් වොෂින්ටන් හෝටලයේ තරප්පු පෙළ මත කේන්ස් ඇද වැටුණේ ය. ජර්මානු පුවත්පතක් ඔහු පිළිබඳ අවමංගල නිවේදනයක් පවා පළ කළේ ය. කෙ සේ වෙතත්, ජූලි 22 දා වන විට ඔහු ගේ තත්ත්වය යහපත් අතට හැරිණි. එ බැවින්, සමුළුවේ අවසන් කාර්යයට සහභාගී අවස්ථාව ඔහුට හිමි විය. ඔහු කාමරයෙන් පිටතට එන විට දෙ පසින් පෙළ ගැසුණු නියෝජිතයෝ "For He's a Jolly Good Fellow" ගීතය ගායනා කරන්නට වූහ.




කේන්ස් - සමුළුවට සහභාගී වූ නියෝජිතයන් සමග

එයින් අවුරුදු දෙකකට පසු - 1946 දී; වැළැඳුණු හෘදයාබාධයෙන් කේන්ස් ගේ ජීවිතය අවසන් විය. වයිට් ජීවත් වූයේ 1948 වන තෙක් පමණකි. අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ අධ්‍යක්ෂවරයකු බවට ද පත් වූ ඔහුට එම තනතුරින් 1947 ජුනි 19 වන දා ඉල්ලා අස්වීමට සිදු විය. සෝවියට් දේශය සමඟ සම්බන්ධකම් පවත්වන කොමියුනිස්ට් නියෝජිතයකු යන චෝදනාව ඔහුට එල්ල වී තිබිණි. එම චෝදනා සම්බන්ධයෙන් 1948 අගෝස්තු මාසයේ දී ඔහුගෙන් ප්‍රශ්න කෙරිණි. එම ප්‍රශ්න කිරීම අවසානයේ දී ඔහුට ද හෘදයාබාධයක් වැළැඳිණි. ඔහු ජීවත් වූයේ තවත් දින තුනක් පමණකි. අගෝස්තු 16 වැනි දා මිය යන විට ඔහු ගේ වයස අවුරුදු 55 කි. ඔහු ගේ මරණයට හේතුව වශයෙන් තහවුරු කෙරුණේ හෘදයාබාධවලට දෙන ඖෂධයක් ප්‍රමාණය ඉක්මවා ගැනීම යන්න යි! ✪


රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 58 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදුව,
ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලදී.